

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்

Sri Lanka Broadcasting Corporation

2019

වාර්ෂික වාර්තාව

ஆண்டறிக்கை

Annual Report

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

වාර්ෂික වාර්තාව

සහ

ගිණුම් ප්‍රකාශනය

2019

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා

මුද්‍රණය : රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව,
පානළුව, පාදුක්ක.

ගරු ජනමාධ්‍ය අමාත්‍යතුමා,

ජනමාධ්‍ය අමාත්‍යාංශය,

කොළඹ.

ගරු අමාත්‍යතුමනි,

1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය ප්‍රකාරව 2019 දෙසැම්බර් 31 දිනට අවසන් වර්ෂය වෙනුවෙන් පහත සඳහන් ලේඛන ඇතුළත් සංස්ථාවේ වාර්ෂික වාර්තාව මේ සමඟ ඉදිරිපත් කරමි.

1 2019 ජනවාරි මස 01 වන දින සිට 2019 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව ඉටුකළ කාර්යයන් පිළිබඳ පාලන වාර්තාව

2 2019 ජනවාරි මස 01 දින සිට 2019 දෙසැම්බර් මස 31 වන දින දක්වා වූ ගිණුම් වර්ෂය සඳහා ගිණුම් සම්බන්ධ වාර්තාව

3 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අවසන් ගිණුම් සම්බන්ධයෙන් වූ විගණකාධිපති වාර්තාව

4 2019 වර්ෂයේ විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාව ඉදිරිපත් කළ පරිකථනය

මෙයට - විශ්වාසී,



සභාපති,

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව,

කොළඹ 07.

2022. 01. 19

පටුන

		පිටු අංක
1	පාලන වාර්තාව	01
2	වාර්ෂික ගිණුම් ප්‍රකාශය	13
3	මූල්‍ය ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති වාර්තාව	45
4	2019 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය	57

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

දැක්ම

යහපත් විද්‍යුත් මාධ්‍ය සංස්කෘතියක් සඳහා පරමාදර්ශ සැපයීම.

මෙහෙවර

බහුජාතික, බහුභාෂාමය, බහු ආගමික සමාජයක සංහිඳියාව, ආර්ථික සංවර්ධනය සහ ප්‍රජාතන්ත්‍රවාදී හර පද්ධතීන් ශක්තිමත් වන පුද්ගල සංවර්ධනය උදෙසා මාධ්‍ය මෙහෙවරක යෙදීම.

අරමුණු

1 ලොව පුරා හටගන්නා දේශපාලන, ආර්ථික, සමාජයීය වැදගත්කමක් සහිත සිදුවීම් පිළිබඳ තොරතුරු රැස්කර නිරවුල්ව ජනතාවට බෙදා දීම.

2 ජනතාව ජීවත්වන පරිසරය තුළ සමාජයේ ක්‍රියාශීලී පුද්ගලයන් ලෙස ක්‍රියාත්මක වීමට ඉඩහසර සලසන පොදු දැනුම රැස්කර ගැනීමට අවශ්‍ය ඉඩ සැලසීම.

3 සමාජය උදෙසා පොදු දැනුම් අරමුදලක් ගොඩනැගීම.

4 මිනිසාගේ පැවැත්ම සඳහා වූ අභියෝග හඳුනාගෙන ඒවාට අවශ්‍ය කෙරෙන දැනුම සම්පාදනය කිරීම.

5 සමාජයේ කඩිනම් හා අවසාන අරමුණු ප්‍රවර්ධනය සඳහා අභිප්‍රේරණය.

6 පොදු කාරණා පිළිබඳ මූලික කරුණු නිර්වචනය, නිරවුල් කිරීමට උපකාරී වීම.

7 පුද්ගලයා සතු කුසලතා, චරිත හා බුද්ධිමය සංවර්ධනය සඳහා වූ දැනුම ලබා දීම හා උත්ප්‍රේරණය

8 ජාතික හෝජන කොට්ඨාශයක සංස්කෘතිය හඳුනා ගැනීම, ආරක්ෂා කිරීම හා සංවර්ධනය කිරීම.

9 විනෝදාස්වාදය සඳහා කටයුතු කිරීම

10 විවිධ ජන කණ්ඩායම් අතර අන්‍යෝන්‍ය අවබෝධයෙන්, සහජීවනය සහ ගෞරවය ඇතිකිරීම සඳහා කටයුතු කිරීම

11 නව තාක්ෂණික වෙනස්කම් යාවත්කාලීනකොට ක්‍රියාවට නැංවීම.

පාලන වාර්තාව - 2019

පාලන වාර්තාව - 2019

හැඳින්වීම

1966 අංක 37 දරන පාර්ලිමේන්තු පනත යටතේ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව 1967 ජනවාරි මස 05 වන දින සිට ක්‍රියාත්මක වන ලෙසට ප්‍රතිෂ්ඨාපනය කරන ලද්දකි.

2019 ජනවාරි මස 01 දින සිට දෙසැම්බර් මස 31 දින දක්වා වූ මාස 12ක කාලපරිච්ඡේදය මෙම වාර්තාවෙන් ආවරණය වේ.

සමාලෝචනයට ලක්වන කාලපරිච්ඡේදය තුළ පහත දැක්වෙන සාමාජිකයෝ සංස්ථා මණ්ඩලයට ඇතුළත් වූහ.

1.	මාලක තල්වත්ත මහතා	සභාපති / සංස්ථා මණ්ඩල සාමාජික
2.	හෙරල්ඩ් සේනාධීර මහතා	ක්‍රියාකාරී අධ්‍යක්ෂ / සංස්ථා මණ්ඩල සාමාජික
3.	එම්. ජේ. ආර්. ඩේවිඩ් මහතා	සංස්ථා මණ්ඩල සාමාජික
4.	ඒ. එම්. පී. ටී. බී. අබේසිංහ මහතා	සංස්ථා මණ්ඩල සාමාජික
5.	ආචාර්ය අසංග ගුණවංශ මහතා	සංස්ථා මණ්ඩල සාමාජික
6.	ඩබ්. ඒ. බී. විමලසිරි මහතා	සංස්ථා මණ්ඩල සාමාජික

- <u>සිංහල ස්වදේශීය සේවය</u>

FM 91.7 හා 91.9 තරංගමාලා ඔස්සේ විකාශය වන ගුවන්විදුලි සංස්ථාවේ සිංහල ස්වදේශීය සේවයට ශ්‍රී ලාංකීය ජනතාවගේ සන්නිවේදන අවශ්‍යතා සැපිරීම වෙනුවෙන් විශේෂ වූ කාර්යභාරයක් පැවරී ඇත. සමාලෝචිත වර්ෂයතුළ එම සුවිශේෂී වගකීම සාධනය කිරීමේ ක්‍රියාමාර්ගයන් කාර්යක්ෂමව අත්පත් කරගැනීමට ස්වදේශීය සේවය සමත්වී ඇත. ජනජීවිතයේ සියලුම පැතිකඩ ආවරණය වන පරිදි ආර්ථික, සාමාජීය, සංස්කෘතික, ආධ්‍යාත්මික හා සදාචාරාත්මක ක්ෂේත්‍රයන්හි ප්‍රගතියක් අත්කර දීම අරමුණු කරගනිමින් 2019 වර්ෂය තුළ පෙර වර්ෂයන්හි සිට අඛන්ඩව පවත්වාගෙන ආ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම මෙන්ම, නව වැඩසටහන් හඳුන්වාදීම ද සිදු කර ඇත. නිදහස් දින උත්සවය, සිංහල දෙමළ අලුත් අවුරුදු උත්සවය, ලෝක කම්කරු දිනය, වෙසක් උත්සවය ඇතුළු සියලුම පොහොය දිනයන් මෙන්ම අන්‍යාගමික සුවිශේෂී දින, විශේෂ හේතු හා පුද්ගලයින් වෙනුවෙන් නම් කර ඇති දිනයන් ආවරණය වන පරිදි වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරය කෙරිණි.

සමාජ ප්‍රශ්න, ගැටලු සහ අවශ්‍යතාවයන් පිළිබඳව වගකිවයුතු පාර්ශවවල අවධානය යොමු කිරීම හා පොදුජන මතයට වේදිකාව නිර්මාණය කිරීමේ අරමුණින්, සමූහයක් එක්ව සාකච්ඡා වැඩසටහන් ආකෘතියෙන් ‘‘සත්‍යාක්ෂණය’’ වැඩසටහනමාසිකව එක් වැඩසටහන බැගින් වැඩසටහන් 12ක් 2019 වර්ෂය තුළ ප්‍රචාරය කෙරිණි.

ගීත සාහිත්‍යය පිළිබඳ ප්‍රසාංගික හා සාකච්ඡාමය වැඩසටහනක් වශයෙන් ශ්‍රාවක ප්‍රජාවගේ රසවින්දනය දියුණු කිරීම අරමුණින් ‘‘මීළඟ මීවිත’’ නමින් වැඩසටහන් 12ක් විවිධ පරාසයන්ගෙන්යුත් ප්‍රවීණ හා නවක කලාකරුවන් සහභාගී කරවා ගනිමින් ප්‍රචාරය කර ඇත.

‘‘සදාචාරාත්මක දේශපාලන සංස්කෘතියකට ස්ත්‍රී නායකත්වය සහ සංහතික මාධ්‍යයේ වගකීම’’ පිළිබඳව තහවුරු කරන විද්වත් කතිකාවක් ලෙස 2019 ජාත්‍යන්තර කාන්තා දිනයේදී සැමරුම් උත්සවයක් හා පුහුණු වැඩමුළුවක් සංවිධානය කෙරිණ.

‘‘ඇමතිතුමාගෙන් අහන්න’’ වැඩසටහන, සෞඛ්‍ය සේවා පිළිබඳව ජනතාව දැනුවත් කිරීමේ අරමුණින් ගරු අමාත්‍යවරයා සම්බන්ධ කරමින් සාකච්ඡාමය වැඩසටහන් වශයෙන් විකාශය කිරීම 2019 වර්ෂයේ ඉටු කරන ලද සාර්ථක වැඩසටහනකි.

අධ්‍යාපන වැඩසටහන්, නිශ්චිත ගුවන්කාලයක් ආවරණය වන පරිදි ස්වදේශීය සේවා ගුවන්කාලය තුළ ක්‍රියාත්මක වේ. සෑම වර්ෂයක මෙන්ම 2019 වර්ෂයේදී විභාග දෙපාර්තමේන්තුව සමඟ එක්ව ප්‍රධාන විභාගවලට ආසන්න කාලයන්හිදී දරුවන් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත. ඊට අමතරව විෂය දැනුම සහිත, සුවිශේෂී ඉගැන්වීම් රටාවන් යොදා ඉගැන්වීම් කරන රජයේ පාසල් ගුරුවරුන් යොදවා, දරුවන්ගේ විෂය දැනුම වර්ධනය කිරීමට අවශ්‍ය වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරය කර ඇත. අධ්‍යාපන පොදු සහතික පත්‍ර , සාමාන්‍ය පෙළ හා උසස් පෙළ යන විභාග ඉලක්ක කරගනිමින් මෙම වැඩසටහන් ක්‍රියාත්මක වේ. 5 වසර ශිෂ්‍යත්ව විභාගය සඳහා ද දරුවන් දැනුවත් කිරීම් හා විෂය ඉගැන්වීම අරමුණු කළ වැඩසටහන් විකාශය කිරීමට අධ්‍යාපන සේවා ගුවන් කාලයේදී සිදු කර ඇත.

විදුල ළමා ගුවන්විදුලිය ද ස්වදේශීය සේවා ගුවන් කාලයේදීම ප්‍රචාරය වේ. ගුවන්විදුලි ළමා ශිල්පීන් බිහි කිරීම සහ ඔවුන් සම්බන්ධ කර ගනිමින් ගුණාත්මක ළමා වැඩසටහන් නිෂ්පාදනය කිරීම, ගුවන්විදුලිය තම වගකීමක් ලෙස ඉටු කරන කාර්යයකි.පෙර වර්ෂයන්හිකළ අයුරින්ම 2019 වර්ෂයේදී දැයේ දූදරුවන් වෙනුවෙන් "විදුල චාරිකා" නමින් ඓතිහාසික වටිනාකම් සහිත ස්ථාන පිළිබඳ වැඩසටහන් මාලාවක්, "පුංචි සිතට දහම් සිසිල" නමින් උපන් දින සැමරුම් සඳහා ආශීර්වාදාත්මක ධර්මදේශනා මාලාවක්, "රටට පිපෙන මල්" නමින් විදුල ළමා ගායන හා වාදන කණ්ඩායම්වල සහභාගීත්වයෙන් දේශාභිමානී ගීත ප්‍රසංගයක් විදුල ළමා ගුවන්විදුලිය 2019 වර්ෂයේ දී ප්‍රචාරය කර ඇත.

ගුවන්විදුලි සංස්ථාවේ ආදායම් උත්පාදනය සඳහා විශේෂ දායකත්වයක් දක්වන අංශයක් වන ආගමික අංශය ද ස්වදේශීය සේවා ගුවන්කාලයේදී ධර්ම දේශනා ප්‍රචාරය කිරීමෙන් ශ්‍රාවකයින්ට ධර්මානුකූල ජීවිතයක් සඳහා මග පෙන්වීම මෙන්ම, ඔවුන් පුන්‍යානුමෝදනා ආදී ආගමික වතාවත්වලට ද දායකත්ව ධර්ම දේශනා මගින් සහභාගී කරගෙන ඇත.

- <u>වෙළෙඳ සේවය</u>

FM 94.3 හා 94.5 ඔස්සේ විකාශය වන සිංහල වෙළඳ සේවය, පෙර වර්ෂයන්හි මෙන්ම 2019 වර්ෂයේදී ද ආර්ථික, සාමාජීය, සංස්කෘතික, ආගමික, දේශපාලනික හා සංගීතමය වැඩසහටන් ප්‍රචාරය කර ඇත. කාලීන මාතෘකා පිළිබඳව සාකච්ඡා කරන "සාර ප්‍රභාගිර" වැඩසටහන, පරිසර අමාත්‍යාංශය හා ජාතික ඕසෝන් වියන රැකගැනීමේ අරමුණ මූලික කොටගෙන ඉදිරිපත් කළ "සොබා කෙත" වැඩසටහන, "හඳමාමා" "සුව අරණ" "ගොවිජන අභිමන්" වැනි සමාජමය වටිනාකම් සහිත වැඩසටහන්, "උරුමය රකිමු දැය සුරකිමු" "මුවන්පැලැස්ස" වැනි සංස්කෘතික වැඩසටහන් "සඳහම් දහර" ආගමික වැඩසටහන, "ඇමතිතුමාගෙන් අහන්න", "ශාන් විජේතුංග සමඟ හෝරාවක්" වැනි දේශපාලනික වැඩසටහන් "රේඩියෝ කොළම", "බොලිවුඩ් ගීත්" "ගීත සම්භාවනාව", "මන්දාකිණිය" "ස්වර වසන්තය" "මාලතී ලතා, ඔබේ නමින් ගී, සලරූ සේයා, මධුරසාංග, දිවා දැහැන, සොඳුරු සෙවන, රන්තරු විමන, සොඳුරු මිනිසා, ධර්ම ප්‍රදීපිකාව, සෙත්කවි" වැනි වැඩසටහන් මෙන්ම "රස ජනනී", "මානව පෝෂණයයි ජෛව විවිධත්වයයි", "යශෝධරා" වැනි අනුග්‍රාහක වැඩසටහන් ද 2019 වසරේ වෙළෙඳ සේවා ගුවන් කාලය හැඩ කළ වැඩසටහන් වේ.

- <u>සිටි එෆ් එම් සේවය</u>

FM 89.6 හා 89.8 ඔස්සේ විකාශය වන සිටි එෆ් එම් සේවයේ අරමුණු වන්නේ, උසස් රසවින්දනයක් සහිත ශ්‍රාවක ප්‍රජාවක් බිහි කිරීම සඳහා දැනුම හා තොරතුරු, නිවැරදිව හා විශ්වසනීයව ශ්‍රාවකයා වෙත යොමු කරමින් තරඟකාරී ගුවන්විදුලි නාලිකා අතර ගුණාත්මක බවින් යුත් ජනප්‍රිය ගුවන්විදුලි නාලිකාවක් බවට පත්වීමයි. පෙර වර්ෂයන්හි මෙන්ම සමාලෝචිත වර්ෂයේදී ද එම අරමුණ මුදුන්පත් කිරීම උදෙසා සිටි එෆ් එම් සේවය ගුවන් කාලය මෙහෙයවා ඇත. "NLB ප්‍රාර්ථනා" ගී රසවින්දන වැඩසටහන, "මුලු රටම එළියයි දසතම කළුඑළියයි" ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන, ලංකා බැංකුවේ අනුග්‍රහයෙන් බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ

පැවති "ආරාධනා ස්වර දැහැන" 2019 වර්ෂයේ පවත්වන ලද සුවිශේෂී වැඩසටහන් වේ. පාසල් දරුවන්ගේ රසවින්දනය පුළුල් කිරීමේ අරමුණින් මාසිකවැඩසටහනක් වශයෙන් ලංකාව පුරා පාසල් ආශ්‍රය කරගනිමින් "මිහිර මනරම්" වැඩසටහන ඉතා සාර්ථකව සමාලෝචිත වර්ෂය තුළ ප්‍රචාරය කර ඇත. ප්‍රවීණ වාද්‍ය ශිල්පී ස්ටැන්ලි ප්‍රනාන්දු මහතා සම්බන්ධ කරගනිමින් වාදන වැඩසටහනක් ද "පාට පොදක්" නමින් ජෝතිපාල උපහාර ගී ප්‍රසංගයක් ද "ආදර කන්ද" නමින් ප්‍රවර්ධන වැඩසටහනක් ද අලුත් අවුරුදු හා නත්තල් විශේෂ වැඩසටහන් ද ඇතුළුව 2019 වර්ෂය පුරා වැඩසටහන් රාශියක් සිටි එෆ් එම් සේවය ඔස්සේ ප්‍රචාරය විය.

- <u>දෙමළ ස්වදේශීය සේවය</u>

FM 102.1 හා 102.3 ඔස්සේ විසුරුවා හැරෙන දෙමළ ස්වදේශීය සේවය, ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ දෙමළ අංශයේ ප්‍රධානතම ගුවන්විදුලි නාලිකාව වේ. සමාලෝචිත වර්ෂයේ ගෙවුණු මාස 12ක කාලය තුළ දෙමළ ස්වදේශීය සේවය ජනතාවගේ ආගමික, සමාජීය, කලා, සංස්කෘතික හා දේශපාලනික තොරතුරු පිළිබඳ උනන්දුවක් දක්වන ජනතාවගේ අවශ්‍යතාවය වෙනුවෙන් වැඩසටහන් ප්‍රචාරය කර ඇත. ජාතික වශයෙන් වැදගත්වන විශේෂ අවස්ථා, විශේෂ විචිත්‍රාංග, කලාපීය සිදුවීම්, කාලීන වැදගත් සිදුවීම්, ළමා වැඩසටහන්, සාකච්ඡා හා සංවාද වශයෙන් විවිධ මානයන් ඔස්සේ වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරය කර ඇති දෙමළ ස්වදේශීය සේවා ගුවන් කාලය තුළ දෙමළ අධ්‍යාපන සේවය හා මුස්ලිම් සේවය ද විකාශය වේ.

දිනපතා ප්‍රචාරය වන "විඩියුම් වලෙ" වැඩසටහන, ගුවන්විදුලියටම විශේෂ වූ වැඩසටහනක් වශයෙන් සජීවීව උත්සවාකාරයෙන් ප්‍රචාරය කෙරෙන තෛපොංගල් උත්සවය, 71 වන නිදහස් දින සමරුවට සමගාමී වැඩසටහන්, මහශිව රාත්‍රී සජීවී වැඩසටහන, අලුත් අවුරුදු වැඩසටහන්, මත්ද්‍රව්‍ය නිවාරණ වැඩසටහන්, මඩු මංගල්‍යය, සරස්වතී පූජාව, හජ්ජි උත්සවය, කැරොල් ගී ප්‍රසංගය, නත්තල් දින දේව මෙහෙය, දෙසැම්බර් 31 රාත්‍රී දේව මෙහෙය, නාට්‍ය හා ජාත්‍යන්තර දිනවලට සමගාමීව ප්‍රචාරය වූ වැඩසටහන් ඇතුළුව වැඩසටහන් රාශියක් 2019 වර්ෂය තුළ ප්‍රචාරයකෙරිණි

- <u>මුස්ලිම් සේවය</u>

FM 102.1 හා 102.3 දෙමළ ස්වදේශීය සේවා තරංගමාලා ඔස්සේ විකාශය වන ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මුස්ලිම් සේවය, ශ්‍රී ලාංකික මුස්ලිම් ජන සමාජය තුළ හා දකුණු ඉන්දියාව තුළ වසර 65කට වැඩි කාලයක් ජනප්‍රියව පවතින අතර මුස්ලිම් ප්‍රජාව වෙනුවෙන් විකාශය වන එකම ජාතික ගුවන්විදුලි නාලිකාව වේ. පැය 0545-0550, 0800-1030, 2000-2100 මුස්ලිම් සේවා ගුවන් කාලය වන අතර, අනුග්‍රාහක දායකත්වය ලැබේ නම් ඊට අදාළව ගුවන් කාලයන් යොදවා මුස්ලිම් සේවා වැඩටසහන් විකාශය වේ. ආගමික වැඩසටහන්, ළමා වැඩසටහන්, සංගීතමය හා නාට්‍යමය වැඩසටහන්, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන්, තරුණ සහරාමය වැඩසටහන්, ජාතික වශයෙන් වැදගත් වැඩසටහන්, ශ්‍රී ලාංකික මැලේ ජනතාව වෙනුවෙන් නිර්මාණය කර ඇති මැලේ මැගසීන්, උර්දු භාෂාව කතා කිරීම සම්බන්ධ වැඩසටහන් 2019 වර්ෂයේ විකාශය කර ඇත. රාමසාන් කාලය තුළ, ශ්‍රී ලාංකික මුස්ලිම් ප්‍රජාව සමඟ ඒකාත්මික වෙමින් වැඩසටහන් ප්‍රචාරය

කිරීම මුස්ලිම් සේවය ඔස්සේ සිදුවන අතර සම්පූර්ණයෙන්ම මෙම මාසයේ වැඩසටහන් සඳහා සේවාදායක අනුග්‍රහය හිමිවේ.

මුස්ලිම් සේවයේ මැදිහත් වීමෙන් සිංහල ස්වදේශීය සේවය ඔස්සේ ඉස්ලාම් ආගමික වැඩසටහනක් සිංහල භාෂාවෙන් ප්‍රචාරය වේ.

2019 මුස්ලිම්සේවා වාර්ෂික ආදායම, රුපියල් 47,817,823.98ක් වේ.

- **<u>තෙන්ඩ්‍රල් සේවය</u>**

FM 104.7 හා 104.9 ඔස්සේ විකාශය වන තෙන්ඩ්‍රල් සේවය, අසන්නන්ගේ විවිධ වූ රසවින්දන අවශ්‍යතා වෙනුවෙන් 2019 වර්ෂය තුළ වැඩසටහන් විකාශය කර ඇත. තෙන්ඩ්‍රල් සේවය විශේෂයෙන්ම ක්‍රියාත්මක වන්නේ තරුණ ප්‍රජාව ඉලක්ක කරගනිමින් වේ. විවිධ වූ සමාජ ස්ථරයන් නියෝජනය කෙරෙන දෙමළ සමාජයේ රසිකත්වය සන්තෘප්ත කිරීමේ අරමුණින් 2019 වර්ෂය තුළ රසවින්දනාත්මක වැඩසටහන් රාශියක් ප්‍රචාරය කර ඇති අතර දෙමළ ස්වදේශීය සේවය හා සමගාමීව ජාතික, දේශපාලනික, ආගමික හා සංස්කෘතික වශයෙන් වැදගත් අවස්ථා සඳහා ද විවිධ වැඩසටහන් ප්‍රචාරය කර ඇත.

- **<u>ඉංග්‍රීසි සේවය</u>**

වසර 70කට අධික කාලයක් පුරා සුවිශේෂී රසවින්දනයක් සහිත ප්‍රජාවක් ගුවන්විදුලි සංස්ථා ඉංග්‍රීසි මාධ්‍ය ගුවන්විදුලිය වන "රේඩියෝ ශ්‍රී ලංකා" සඳහා එක්රොක් වී ඇති අතර 2019 වර්ෂයේදී ද සංස්කෘතික, ආගමික, සමාජීය, රසවින්දනාත්මක හා කාලීන වැදගත්කමකින් යුත් වැඩසටහන් රාශියක් රේඩියෝ ශ්‍රී ලංකා ඔස්සේ ඉදිරිපත් කර ඇත. ජාතික හා ජාත්‍යන්තර වැදගත්කම් ඇති විශේෂ දිනයන් අලලා වැඩසටහන් ඉදිරිපත් කිරීම 2019 වර්ෂයේදී ද සිදුව ඇත. පැරණි ගීත ප්‍රිය කරන අති විශාල රසික ප්‍රජාවක් රේඩියෝ ශ්‍රී ලංකා සමඟ එක් රොක් වී සිටින අතර ඔවුන්ගේ රසවින්දනය මුදුන්පත් කිරීමේ අරමුණින්, ගුවන්විදුලි සංස්ථා ඉංග්‍රීසි ගීත පුස්තකාලයේ ඇති අතිශය පැරණි ගුණාත්මක හා විනෝදාත්මක වැඩසටහන් සේම ගීත ද ඉදිරිපත් කිරීම ගුවන්විදුලි සංස්ථා ඉංග්‍රීසි සේවයේ මූලිකම කටයුත්ත වේ.

ලෝක ළමා දිනය අළලා, පාසල් 10ක දරුවන් 200 දෙනෙක් පමණ සහභාගීත්වයෙන් ප්‍රාසාංගික ගුවන්විදුලි වැඩසටහනක් නිෂ්පාදනය කර ප්‍රචාරය කිරීම, "ගෝල්ඩන් මෙලඩීස්" නමින් ප්‍රාසාංගික සංගීතමය වැඩසටහන 2019 වර්ෂයේ නිර්මාණය කළ විශේෂ වැඩසටහන් ලෙස හඳුන්වා දිය හැක.

- **<u>ප්‍රාදේශීය සේවා.</u>**

සමාලෝචිත වර්ෂය තුළ, ප්‍රධාන ප්‍රාදේශීය සේවා ලෙස සිංහල මාධ්‍යයෙන් විකාශන කටයුතු පවත්වාගෙන යන රජරට, රුහුණ, කඳුරට හා වයඹ සේවය ක්‍රියාත්මක විය. නැගෙනහිර පළාතේ මුස්ලිම් ප්‍රජාව මූලික කරගනිමින් පිරෙයි එෆ් එම් සේවයත් යාපනය අර්ධද්වීපය මූලික කරගනිමින් යාල් එෆ් එම් සේවයත් දෙමළ මාධ්‍ය ප්‍රාදේශීය සේවා ලෙස ක්‍රියාත්මක විය. රේඩියෝ දඹාන, දඹානේ ආදී වාසී ජනතාව මූලික කර ගනිමින් ප්‍රජා ගුවන්විදුලියක් ලෙස ක්‍රියාත්මක විය.

ඒ ඒ ශ්‍රවණ කලාපවල ජීවත්වන ජනතාවගේ කෘෂිකාර්මික, අධ්‍යාපනික, සෞඛ්‍ය, පාරිසරික, ක්‍රීඩා හා වෙනත් වැදගත් විෂයන්ට අදාල මාතෘකා ඔස්සේ වැඩසටහන් නිෂ්පාදනය කර ප්‍රචාරය කිරීම ප්‍රාදේශීය සේවාවලින් සිදුවේ.

පෙර වර්ෂයන්හි මෙන්ම 2019 වර්ෂය තුළද, ශ්‍රවණ කලාප විශේෂ කරගනිමින්ජාතික උත්සව, පෝදා වැඩසටහන්, වෙනත් ආගමික වැඩසටහන්, පෙරහැර වැනි සංස්කෘතිකාංග, ඒ ඒ පළාත්වල ගැටලු වශයෙන් හඳුනාගන්නා, වකුගඩු රෝගය, තැලසීමියාව වැනි රෝග සම්බන්ධ වැඩසටහන්, ඓතිහාසික වැඩසටහන් රාශියක් මෙම ප්‍රාදේශීය සේවා ඔස්සේ ප්‍රචාරය කර ඇත.

ආදීවාසී ප්‍රජාවගේ සංස්කෘතිකාංග, භාෂාව හා කලාකෘති තවදුරටත් පවත්වාගෙන යමින්, ඔවුන්ගේ ජන ජීවිතය ඉහළ තළයකට ගෙන ඒම අරමුණු කරගනිමින් ජාතික වගකීමක් හා සේවයක් ලෙස 2019 වර්ෂය තුළ රේඩියෝ දඹාන, ප්‍රජා ගුවන්විදුලියක අරමුණු වෙත ලඟා වී ඇත.

- **<u>ප්‍රවෘත්ති හා කාලීන වැඩසටහන් අංශය</u>**

වඩාත් නිවැරදි ප්‍රවෘත්ති වගකීමෙන් හා විශ්වාසයෙන් යුතුව ජනතාව වෙත ලබා දීම ගුවන්විදුලි සංස්ථා ප්‍රවෘත්ති අංශයේ වගකීමයි. 2019 වර්ෂයේ දී ද දිනපතා ප්‍රවෘත්ති ප්‍රකාශ 04ක් භාෂාත්‍රයෙන්ම ඉදිරිපත් කර ඇත. විශ්වසනීයත්වය උදෙසා හඬ කොටස් ඉදිරිපත් කිරීම සිදු කර ඇත. ඊට අමතරව පැයේ පුවත්, දිනපොත, ළමා ප්‍රවෘත්ති ආදිය ඉදිරිපත් කිරීම ද ප්‍රවෘත්ති අංශයේ අධීක්ෂණය හා මැදිහත් වීමට යටතේ සිදුවන කටයුතු ය.

“සුභාරතී” “ඇතුල්පැත්ත” “සත්‍යෝක්ෂණය” ආදී වැඩසටහන් සමාජයේ පවතින කාලීන සිද්ධීන් අදාල කර ගනිමින්, රජයේ සංවර්ධන කටයුතු ජනතාව අතරට ගෙනයාමට අදාලව, අර්බුද ගැටුම් මතවාද තුළින් නිවැරදි මගට යන තේමාව ඔස්සේ ප්‍රවෘත්ති අංශය මගින් නිෂ්පාදනය කොට ප්‍රචාරයට යොදන වැඩසටහන් වේ.

ඊට අමතරව පාර්ලිමේන්තු සැසිවාර සජීවීව විකාශය කිරීමද 2019 වර්ෂයේ සිදුවිය.

වර්තමානය වන විට ජනතාව වඩාත් සමීප වී ඇති නව මාධ්‍ය ඔස්සේ ද ප්‍රවෘත්ති ජනගත කිරීමේ කටයුතු ගුවන්විදුලි සංස්ථා ප්‍රවෘත්ති අංශය විසින් ආරම්භ කර ඇති අතර ඒ වෙනුවෙන්ම ආරම්භ කර ඇති නව මාධ්‍ය ඒකකය, සමාජ මාධ්‍ය තුළ ගුවන්විදුලි සංස්ථාව තරඟකාරීව පවත්වාගෙන යාමට

- **<u>සංවර්ධන ඒකකය.</u>**

2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා අතිගරු ජනාධිපතිතුමා සහභාගී වූ විවිධ උත්සවය සඳහා මාධ්‍ය ආවරණය ලබා දීමේ කටයුතු සංවර්ධන ඒකකය මගින් සිදු කර ඇත. එම උත්සව අවස්ථාවල ජනාධිපතිතුමා පවත්වන ලද කතා සංරක්ෂණය කිරීමද සංවර්ධන ඒකකයට පැවරී ඇති කටයුත්තකි. මෙම උත්සව සම්බන්ධ පූර්ව ප්‍රචාරක කටයුතු ද සංවර්ධන ඒකකය මගින් ඉටු කර ඇත. ජනාධිපතිතුමා සහභාගීවන විශේෂ විදේශ සංචාරයන්හි තත්ත්ව විස්තර වාර්තා ලබා දීම ද සංවර්ධන ඒකකය මගින් සිදු කර ඇත. එමෙන්ම අග්‍රාමාත්‍යතුමා සහභාගීවන නිල වැඩසටහන්

ආවරණය කිරීම, ඒ පිළිබඳ වූ වැඩසටහන් නිෂ්පාදනය හා ප්‍රචාරය කිරීමද සංවර්ධන ඒකකය මගින් සිදු කෙරේ.

- **<u>සංගීත අංශය</u>**

සංගීත වැඩසටහන් නිෂ්පාදනය කිරීම, නව ගීත නිර්මාණය, සංගීත ප්‍රසංග සඳහා සංගීතය සැපයීම, සංගීත ප්‍රසංග සංවිධානය කිරීම ආදී සංගීත ක්ෂේත්‍රයට අදාල සියලුම නිර්මාණ කටයුතු පවත්වාගෙන යාමේ වගකීම පැවරී ඇත්තේ සංගීත අංශයටය. 2019 වර්ෂය තුළ සංස්ථාවේ සෑම නාලිකාවක් සඳහාම සංගීත අංශය සිය දායකත්වය සපයා ඇත. උත්තර භාරතීය රාගධාරී සංගීතාංග ඇතුළත් ''සරස රාවය'', දේශීය සම්ප්‍රදායික ජන ගායනා ඇතුළත් කර විදුල ළමා ගුවන්විදුලිය ඔස්සේ ප්‍රචාරය වන ''ජනගී'' වැඩසටහන හා සාම්ප්‍රදායික ජන ගායනා, ජන ගී ප්‍රතිනිර්මාණ්‍ය හා ජන ගී නාද රටා ඇසුරින් නිර්මාණය වූ ''හෙළ ගී සිත්තම්'', ගුවන්විදුලි සංස්ථා සරළ ගී ශිල්පීන් යොදවා නිෂ්පාදිත ''සරළ ගී'' වැඩසටහන්, විශ්ව සංගීතයේ විවිධ ගායන හා වාදන, ශ්‍රී ලාංකික සුභාවිත ගීත මෙන්ම උත්තර භාරතීය රාගධාරී සංගීතයේ එන ශාස්ත්‍රීය, සරළ ශාස්ත්‍රීය ගායන හා වාදන, බටහිර සංගීතයෙහි එන ඔපෙරා, සංධවනි හා විවිධ ශෛලීන් ඇතුළත් කොට නිෂ්පාදිත ''පන්සිළු අමාව'', ''සේවක සංග්‍රහය'', ''විශ්වයේ වින්දනීය ප්‍රතිරාව'', ''ශ්‍රද්ධාංජලී'', ආචාර්ය ප්‍රණීත් අබේසුන්දරයන් සම්පත්දායකත්වය ලබා දෙන ''ඉරිදා සංග්‍රහය'', අධ්‍යාපනික වැඩසටහනක් වූ ''ලලිත කළාලය'' ධම්මපද ඇසුරෙන් කළ ගී නිර්මාණ සහිත ''ධම්ම පද ගී'' වැඩසටහන් සංගීත අංශය විසින් නිර්මාණය කර ප්‍රචාරයට යොදා ඇත. ඊට අමතරව, ''වසන්ත වීණා'' ''නාද සිත්තම්'' වැඩසටහන් ද නිර්මාණය කර ඇත.

- **<u>ප්‍රකාශන අංශය</u>**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ප්‍රකාශන, නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධයෙන් වගකීම පැවරී ඇත්තේ ප්‍රකාශන අංශය වෙතයි. 2019 වර්ෂය තුළ නව ප්‍රකාශන කිසිවක් නිෂ්පාදනය කිරීම සිදු කර නොමැති අතර, පෙර සිට නිෂ්පාදනය කර ඇති සංස්ථා ප්‍රකාශන අලෙවිය සිදු කර ඇත.

සංස්ථාව විසින් සංවිධානය කරන ලද විවිධ උත්සව අවස්ථාවන්වල අලෙවි කටයුතු පවත්වාගෙන ගොස් ඇති අතර, ගුවන්විදුලි සංස්ථා අලෙවි නියෝජිත ජාලය ඔස්සේ සහ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේදී ද ගුවන්විදුලි සංස්ථා ප්‍රකාශන වන, සංයුක්ත තැටි සහ හඬ සඟරාව අලෙවි කර ඇත.

- **<u>මධ්‍යම ක්‍රියාකාරී අංශය.</u>**

2019 වර්ෂය තුළ මධ්‍යම ක්‍රියාකාරී අංශය, ගුවන්විදුලි සංස්ථාවේ අරමුණු කරා ලඟා වීමට සුවිශේෂී ආයතනික මෙහෙවරක් ඉටු කර ඇති අතර සිංහල, දෙමළ, ඉංග්‍රීසි, හින්දි, තෙළඟු සහ මලයාලම් භාෂාවලට අයත් විවිධත්වයෙන් යුත් වැඩසටහන් පටිගත කිරීම, සංස්කරණය කිරීම, බාහිර පටිගත කිරීම, සජීවී සම්බන්ධතා මැදිරිවල වැඩසටහන් ගුණාත්මක බවින් ඉහළ තලයක පවත්වාගෙන යමින් විකාශනයට සහය වීම හා වෙළඳ දැන්වීම් නිෂ්පාදනය කිරීම, ඒවා ඉතා කාර්යක්ෂමව දෛනික වෙළඳ පත්‍රිකාවේ පරිදි ප්‍රචාරයට සහය වෙමින් ආයතනයේ අනන්‍යතාව රැකගනිමින් තාක්ෂණික මෙහෙවරින් දායකවීම ඇතුළු තම අංශය වෙත පැවරී ඇති අති විශාල කාර්ය භාරය

විධිමත් හා කාර්යක්ෂම ලෙස ඉටු කර ඇත. මෙම කටයුතු සඳහා වැඩසටහන් නිෂ්පාදකවරුන් තාක්ෂණික දායකත්වය සපයන අතර මැදිරි සේවා කාර්ය මණ්ඩලය විසින් මැදිරිවලට අවශ්‍ය සේවා පහසුකම් සැපයීම සිදු කර ඇත.

වැඩසටහන් පටිගත කිරීම, විශේෂ සංගීත හා විචිත්‍රාංගමය වැඩසටහන් පටිගත කිරීම සඳහා සංස්ථාවේ ක්‍රියාත්මක මැදිරි වෙන් කිරීම හා සජීවී සම්බන්ධතා මැදිරි පවත්වාගෙන යෑමට අදාළ දෛනික වැඩසටහන් පත්‍රිකාව සකස් කර ඊට අනුකූලව වැඩසටහන් නිෂ්පාදන සහායක සේවාමුර පත්‍රිකා පිළියෙල කිරීම ආදී කටයුතු සිදුවන්නේද මධ්‍යම ක්‍රියාකාරී අංශයෙන් වන අතර මැදිරි වෙන් කිරීම සඳහා වෙන් වූ කාර්ය මණ්ඩලයක් ද සේවයේ යොදවා ඇත.

ගුණාත්මක වැඩසටහන් ශ්‍රාවකයින් වෙත ලබා දීමේ කාර්යයෙහි ලා වැඩි වගකීම් පැවරෙන අංශයක් වන මධ්‍යම ක්‍රියාකාරී අංශය ගුවන්විදුලි සංස්ථාවේ සියලුම අංශ සමඟ මනා සහයෝගයක් පවත්වා ගනිමින් සංස්ථාව ආරම්භයේ සිට මේ දක්වා කාර්යක්ෂමව ක්‍රියාත්මක වී ඇති අතර 2019 වර්ෂය තුළ ද තම වගකීම මනාව ඉටු කර ඇත.

2019 ගුවන්විදුලි රාජ්‍ය සම්මාන උළෙලේදී ප්‍රශස්ත නාද ශික්ෂණයට හිමි සම්මානය මධ්‍යම ක්‍රියාකාරී අංශයේ වැඩසටහන් නිෂ්පාදන සහායක මලින්ත දේශප්‍රිය මහතාට හිමි විය.

- **<u>පර්යේෂණ පුහුණු හා විදේශ සම්බන්ධතා අංශය.</u>**

බාහිර අභ්‍යාසලාභීන් සඳහා මෙන්ම අභ්‍යන්තර අවශ්‍යතා සඳහා ද පුහුණු අවස්ථා සලසා දීම, ගුවන්විදුලි පර්යේෂණ ක්‍රියාත්මක කිරීම මෙන්ම විදේශ සම්බන්ධතා විධිමත්ව කළමනාකරණය කිරීම පර්යේෂණ, පුහුණු හා විදේශ සම්බන්ධතා අංශයට පැවරී ඇති රාජකාරි වේ.

- **ශ්‍රවණ පර්යේෂණ අංශය**

දේශීය සේවාවන්හි වැඩසටහන්වල ගුණාත්මක භාවය, ශ්‍රවණ තත්ත්වය හා ශ්‍රාවක ප්‍රජාව ආදිය පිළිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අනුරූපව විසඳුම් යෝජනා කිරීම ශ්‍රවණ පර්යේෂණ අංශයට පැවරී ඇති වගකීම වේ. ඒ අනුව කටයුතු කරමින් 2019 වර්ෂයේදී ද දේශීය සේවාවන්වල ප්‍රචාරය වන වැඩසටහන් පිළිබඳ ශ්‍රාවක තෘප්තිමත් භාවය හඳුනාගැනීම, දේශීය සේවාවන්හි ශ්‍රවණ තත්ත්වය පිළිබඳ ශ්‍රාවක ප්‍රතිචාර, දේශීය සේවාවන්වල වැඩසටහන් පිළිබඳ ශ්‍රාවක ප්‍රතිචාර ආදිය පිළිබඳ සමීක්ෂණ පැවැත්වීම සිදු කර ඇත. වැඩසටහන් සඳහා දෛනික වැදගත් තොරතුරු ඉදිරිපත් කිරීම, ගුවන්විදුලිය පිළිබඳ තොරතුරු ගවේශනය කරන විද්‍යාර්ථයින්ට, පාසල් සිසුන්ට අවශ්‍ය තොරතුරු සම්පාදනය කිරීම, ගුවන්විදුලි සංස්ථාව පිළිබඳ අත්පත්‍රිකාව යාවත්කාලීන කර පවත්වාගෙන යාම 2019 වර්ෂයේදී ශ්‍රවණ පර්යේෂණ අංශය මගින් ඉටු කර ඇත.

- **පුහුණු අංශය**

ගුවන්විදුලි නිෂ්පාදන හා සන්නිවේදන සහතික පත්‍ර තෙමාසික පාඨමාලා, කණ්ඩායම් දෙකක් සඳහා ද කැලණිය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යයන් දෙදෙනෙකු සඳහා මාස 03ක ආයතනික පුහුණුව ද බාහිර අභ්‍යාසලාභීන් සඳහා 2019 වර්ෂය තුළ ලබා දුන් පුහුණු වැඩමුළු වේ.

ඊට අමතරව ගුවන්විදුලි අභ්‍යන්තර කාර්ය මණ්ඩලයේ සන්නිවේදන දැනුම පුළුල් කිරීම, පරිපාලනමය දැනුම වර්ධනය කරමින් විධිමත් කාර්යාල ක්‍රමයක් පවත්වා ගැනීම ආදී අභ්‍යන්තර පුහුණු අවශ්‍යතා සඳහා, ගුවන්විදුලි වැඩසටහන් ආකෘති සම්බන්ධ එක් දින වැඩමුළුව, රියදුරු මහතුන් සඳහා ධනාත්මක චින්තනය සම්බන්ධ දෙදින වැඩමුළුව, කාර්යාල කාර්ය සහායක, මැදිරි සහායක හා සිවිල් අංශය සඳහා නිපුණතා සංවර්ධන එක්දින වැඩමුළුව, කළමනාකරණ සහකාරවරුන් සඳහා කාර්යාල කළමනාකරණය හා මුදල් රෙගුලාසි පිළිබඳ එක්දින වැඩමුළුව, දින 07ක යතුරුලියන පුහුණුව, ක්‍රීඩා විස්තර විචාරක ප්‍රායෝගික සැසියේ ප්‍රතිපෝෂණය, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ විධිවිධාන සහ සැළසුම්කරණය පිළිබඳ දින 03ක වැඩමුළුව, පාලන අංශයේ කාර්ය මණ්ඩලය සඳහා දින 07ක පරිගණක පුහුණුව, බඳවා ගැනීමේ පරිපාටිය පිළිබඳ දින 03ක වැඩමුළුව, ඉංග්‍රීසි නිදහස් නිවේදක පුහුණුව (දින 05), ආයතන සංග්‍රහය පිළිබඳ දෙදින වැඩමුළුව 2019 වර්ෂයේ ක්‍රියාත්මක කළ අභ්‍යන්තර පුහුණු වැඩමුළු වේ.

ඉංජිනේරු අංශයේ නිලධාරීන් 04 දෙනෙකු සඳහා සිංගප්පූරුවේ දින 03ක වැඩමුළුවක් සඳහා යොමු කිරීම ද 2019 වර්ෂයේ පුහුණු හා විදේශ සම්බන්ධතා අංශය මඟින් ඉටු කළ කාර්යන් වේ.

- <u>ඉංජිනේරු අංශය</u>

ගුවන්විදුලි සංස්ථා ඉංජිනේරු අංශය මඟින් 2019 වර්ෂය තුළ ඉටු කරන ලද කාර්යයන්

- ✓ කොළඹ සහ යටියන්තොට විකාශනාගාර සඳහා Audio Processors 09ක් ස්ථාපනය කිරීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 12.1කි.
- ✓ ප්‍රධාන කාර්යාලය සඳහා අකුණු සන්නායක පද්ධතියක් ස්ථාපනය කිරීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 16.8කි.
- ✓ ප්‍රධාන කාර්යාලය සඳහා ආරක්ෂිත කැමරා පද්ධතියක් ස්ථාපනය කිරීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 3.2කි.
- ✓ නිෂ්පාදන මැදිරි සඳහා UPS පද්ධතියක් ස්ථාපනය කිරීම.
  ව්‍යාපෘතියේ වටිනාකම රුපියල් මිලියන 3.5කි.

- <u>අලෙවි අංශය</u>

2019 වර්ෂයේදී අලෙවි අංශයේ ප්‍රවර්ධන වැඩසටහන්

- ✓ හින්දි ගීත ගායනයට දක්ෂතා සහිත ආධුනිකයින් සඳහා වේදිකාවක් සකස් කර දෙමින් සිංහල වෙළඳ සේවය ඔස්සේ රියැලිටි වැඩසටහනක් වශයෙන් ‘‘බොලිවුඩ් ෂෝ’’ ප්‍රසංගය පැවැත් වූ අතර එය වෙළඳ සේවයේ ඉතා ජනප්‍රිය වැඩසටහනක් විය.

- ✓ ගීත ගායනයට දක්ෂතා සහිත විවිධ වෘත්තිකයින්ගේ සහභාගීත්වයෙන් මාසික ගුවන්විදුලි රියැලිටි වැඩසටහනක් ලෙස "සොඳුරු සියොතුන්" නමින් සංගීත ප්‍රසංග මාලාවක් සිටි එම් සේවය ඔස්සේ ප්‍රචාරය කෙරිණි.

- ✓ පාසල් දරුදැරියන්ගේ සුභාවිත ගීතය පිළිබඳ රසවින්දනය පුළුල් කිරීමේ අරමුණින් පාසල් මූලික කරගනිමින් ගුවන්විදුලි සංස්ථා වාදක මණ්ඩලය හා ප්‍රවීණ ගායක ගායිකාවන්ගේ සහභාගීත්වයෙන් "මිහිර මනරම්" නමින් වැඩසටහන් මාලාවක් ප්‍රචාරය කළ අතර තාරුණ්‍යයට උසස් රසවින්දනයක් ලබා දීම එහි අරමුණ විය.

ගිණුම් ප්‍රකාශනය - 2019

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

(සියලු ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන	2019	2018
		දෙසැම්බර් 31	දෙසැම්බර් 31
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපල, පිරියත හා උපකරණ	9	2,162,736,211	2,311,430,062
විලම්බිත බදු වත්කම්	8	11,555,647	8,970,648
මෘදුකාංග	9	10,745,170	2,977,263
සිදුකෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	10	17,032,793	21,389,180
ස්ථීර තැන්පතු		77,023,784	69,818,185
ආයෝජන	11	1,000,000	1,000,000
		2,280,093,604	**2,415,585,336**
ජංගම වත්කම්			
ඉන්වෙන්ටරි	12	20,025,662	47,118,087
වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ	13	235,393,552	247,924,946
මුදල් හා මුදලට සමාන දෑ	14	116,175,232	161,820,848
		371,594,446	**456,863,880**
මුළු වත්කම්		**2,651,688,050**	**2,872,449,215**
ස්කන්ධ ප්‍රාග්ධනය හා බැරකම්			
ප්‍රාග්ධන හා සංචිත			
ප්‍රකාශිත ප්‍රාග්ධනය		307,386,085	307,386,085
ප්‍රත්‍යාගණන සංචිත		11,971,999	11,971,999
රඳවාගත් ඉපැයුම්	15	(203,004,112)	(98,140,157)
		116,353,972	**221,217,928**
අවිනිශ්චිත බැරකම්		11,783,507	11,783,507
ජංගම නොවන බැරකම්			
නිර්වචිත ප්‍රතිලාභී වගකීම්	20	232,428,448	197,804,973
විදේශ දීමනා	19	857,697,784	1,064,823,598
රජයේ ප්‍රදාන		827,690,965	805,199,976
අනෙකුත් ගෙවිය යුතු දෑ	18	8,551,384	13,403,384
විලම්බිත බැරකම්	8	131,349,681	109,840,670
		2,057,718,262	**2,191,072,602**
ජංගම බැරකම්			
නිර්වචිත ප්‍රතිලාභී වගකීම්	20		2,517,832
වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ	16	358,002,646	323,372,573
මූල්‍යමය නොවන බැරකම්	17	107,829,664	122,484,772
මුළු බැරකම්		**465,832,310**	**448,375,177**
මුළු ස්කන්ධය සහ බැරකම්		**2,651,688,050**	**2,872,449,215**

ශ්‍රී ලංකා වාර්තාකරණ ප්‍රමිති, 1971 අංක 38 දරණ මූල්‍ය පනත සහ 1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත සමඟ අනුකූල වන පරිදි මෙම මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇති බව මුදල් අධ්‍යක්ෂ සහතික කරයි

ලලිත් හෙට්ටිගේ මහතා
අධ්‍යක්ෂ මුදල්

දිනය 10/03/2020

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු වේ.
මෙම මූල්‍ය ප්‍රකාශ 2020 ජූනි 17 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.

ජගත් වික්‍රමසිංහ	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
සභාපති	දිනය 08/07/2020	දිනය .....
දිනය		

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

විස්තීරණ ආදායම් ප්‍රකාශය

(සියලු ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	සටහන	2,019 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා	2,018 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා
විකුණුම්	1	**659,857,071**	658,556,215
විකුණුම් පිරිවැය	2	**644,632,855**	630,013,674
දළ ලාභය		**15,224,215**	**28,542,541**
වෙනත් මෙහෙයුම් ආදායම්	3	**350,298,093**	**328,401,681**
බෙදාහැරීමේ පිරිවැය	4	**-**	**2,231,926**
වෙනත් මෙහෙයුම් වියදම්	5	**359,430,850**	**348,330,839**
පරිපාලන වියදම්	6	**396,388,501**	**386,726,869**
මෙහෙයුම් ලාභය		**(390,297,043)**	**(380,345,412)**
මූල්‍ය පිරිවැය	7	**4,073,406**	**2,972,696**
රජයේ දීමනා වලට පෙර ලාභය / (පාඩුව)		**(394,370,449)**	**(383,318,108)**
රජයේ දීමනා	3.1	**365,000,000**	**360,000,000**
රජයේ දීමනා වලට පසු ලාභය / (පාඩුව)		**(29,370,449)**	**(23,318,108)**
විලම්භිත බදු	8	**(18,924,012)**	**(28,005,270)**
අනෙකුත් විස්තීර්ණ ආදායම්	20	**(56,569,495)**	**8,653,266**
බදු පසු ලාභය		**(104,863,956)**	**(42,670,112)**
මුළු විස්තීර්ණ ආදායම		**(104,863,956)**	**(42,670,112)**

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය

(සියලු ප්‍රමාණ ශ්‍රී ලංකා රුපියල් වලින් දක්වා ඇත)

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණන සංචිත	රඳවාගත් ඉපැයීම්	එකතුව
2018 ජනවාරි 1 දිනට ශේෂය	307,386,085	11,971,999	-	319,358,084
විස්තීර්ණ ආදායම්				
විස්තීර්ණ ආදායම			(42,670,112)	(42,670,112)
රඳවාගත් ඉපැයීම්			(55,470,045)	(55,470,045)
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**307,386,085**	**11,971,999**	**(98,140,157)**	**221,217,928**
ප්‍රාග්ධන සංචිත				-
විස්තීර්ණ ආදායම				
අදාල කාල සීමාව සඳහා විස්තීර්ණ ආදායම			(104,863,956)	(104,863,956)
ආදායම් සංචිතය				-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**307,386,085**	**11,971,999**	**(203,004,112)**	**116,353,972**

2019 දෙසැම්බර් 31න් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

විස්තරය	2019		2018	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් මුදල් ප්‍රවාහය				
බදු සහ පොළී වලට පෙර ශුද්ධ ලාභය		(29,370,449)		(20,127,590)
ගැලපීම්				
රජයේ ප්‍රදානයේ ක්‍රම ක්ෂය	(107,878,577)		(86,531,268)	
ත්‍රිකුණාමල ප්‍රදානයේ ක්‍රම ක්ෂය	(155,406,674)		(155,406,674)	
ක්ෂය වීම්	97,492,400		78,900,888	
ක්ෂය වීම් - ත්‍රිකුණාමලය	161,224,994		159,846,172	
මෘදුකාංග ක්‍රම ක්ෂය	2,913,028		830,250	
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	30,471,666		31,435,470	
බොල් ණය සඳහා ප්‍රතිපාදනය	(1,958,535)		2,231,926	
නිදහස් කළ වත්කම්	(1,230,370)			
විනිමය මත ලාභ / අලාභ	(81,301)		(803,628)	
ESC	3,669,880	29,216,510	3,769,850	34,272,984
		(153,939)		14,145,394
ආදායම් සංචිත ගැලපුම්				(207,000)
කාරක ප්‍රාග්ධන වෙනස්කම් වලට පෙර මෙහෙයුම් ලාභ				
ඉන්වෙන්ට්‍රි භාණ්ඩ ඉහල යාම / පහල යාම	27,092,425		(1,999,520)	
වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ ඉහල යාම / පහල යාම	14,489,929		(6,261,324)	
මාර්ගස්ථ භාණ්ඩ වල ඉහල යාම / පහල යාම			(108,923)	
වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ඉහල යාම / පහල යාම	29,778,073		56,365,560	
මූල්‍යමය නොවන බැරකම් වල ඉහල යාම / පහල යාම	(14,564,709)	56,795,717	(20,429,685)	27,566,108
		56,641,779		
ගෙවන ලද පාරිතෝෂික		(54,935,519)		(49,736,515)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල්				(8,232,013)
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ				
ස්ථාවර තැන්පතු පොළිය	(7,205,599)		(6,449,587)	
රජයේ ප්‍රදාන	126,000,000		19,672,630	
වත්කම් නිදහස් කිරීම්	7,352,777			
දේපල, පිරියත හා උපකරණ මිලදී ගැනීම	(162,910,503)		(70,790,307)	
සිදු කෙරෙමින් පවත්නා ප්‍රාග්ධන වැඩ	(3,235,774)		(60,730,197)	
ආයෝජන කටයුතු වලින් මුදල් ප්‍රවාහ		(47,351,876)		(118,297,461)
මුදල් හා		(45,645,616)		(126,529,474)
මුදල් සමාන දෑ වල ඉහල යාම / පහල යාම				
කාල සීමාව ආරම්භයේ මුදල් හා				288,350,322
මුදල් සමාන දෑ				
කාල සීමාව අවසානයේ මුදල් හා		**116,175,232**		**161,820,848**
මුදල් සමාන දෑ (සටහන 14)				

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

1. සාමාන්‍ය තොරතුරු

1.1 වාර්තාකරණ අස්ථිත්වය

1966 අංක 37 දරණ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථා පනත යටතේ නිසි පරිදි සංස්ථාගත කොට ස්ථාපනය කොට ඇති ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික කටයුතු සිදුකරන ස්ථානය කොළඹ 07 නිදහස් චතුරශ්‍රයේ පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම් වල ස්වභාවය

වර්ෂය තුල, සංස්ථාවේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ, ගුවන් කාලය විකිණීමයි.

1.3 නිකුත් කිරීම සඳහා බලය පවරණ ලද දිනය

2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ 2020ක් වූ ජූනි මස 17 වන දින අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී.

1.4 සේවක සංඛ්‍යාව

වර්ෂය අවසානය වන විට ස්ථිර සේවක සංඛ්‍යාව 710ක් වූ අතර වර්ෂය අවසානය වන විට කොන්ත්‍රාත් පදනමින් සේවයෙහි යෙදී සිටි සංඛ්‍යාව 95ක් විය.

(31.12.2018 – 847)

2. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් ('SLFRS") සකස් කිරීමේ පදනම සහ ඒවා යොදා ගැනීම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS") සහ 1995 අංක 19 දරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව සංස්ථාව සිය මූල්‍ය ප්‍රකාශ සකස් කර ඇත.

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති ("SLFRS') නව වෙළුමක් නිකුත් කර ඇති අතර 2012 ජනවාරි මස 01 වන දින සිට හෝ ඉන් අනතුරුව ආරම්භ වන වර්ෂය සඳහා බලාත්මක වන පරිදි ව්‍යවසායකයන් මෙම ප්‍රමිති ආදේශ කිරීම අවශ්‍ය කරනු ලබයි.

3.1 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී යොදාගත් මූලික ගිණුම්කරණ ප්‍රතිපත්ති පහත විස්තර කොට ඇත. අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්නේ නම් මිස, ඉදිරිපත් කර ඇති සියලු වසර සඳහා මෙම ප්‍රතිපත්ති එකාකාරව ආදේශකර ඇත.

3.1.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS) අනුකූලවය. මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සහ

පසුව පැහැදිලිකොට ඇති අනෙකුත් නිශ්චිත මැනුම් යටතේ පිළියෙල කර ඇත. මූල්‍ය ප්‍රකාශ කෙරෙහි බලපාන උද්ධමනීය සාධක සඳහා ගැලපීම් සිදුකර නොමැත.

මූල්‍ය පකාශ කෙරෙහි බලපාන උද්ධමනීය සාධක වෙනුවෙන් ගැලපීම් සිදු කොට නොමැත.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කරන ලද්දා වූ මූල්‍ය ප්‍රකාශ සම්බන්ධයෙන් බරපතල ගිණුම්කරණ ඇස්තමේන්තු භාවිතා කළ යුතු වේ. තවද, ගුවන්විදුලි සංස්ථාවේ ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගත කිරීමේ ක්‍රියාවලියෙහිදී කලමනාකාරීත්වය විසින් සිය විනිශ්චය ක්‍රියාවට නැංවීම අවශ්‍ය වේ. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ඇති උපකල්පන සහ ඇස්තමේන්තු වැදගත් වන ක්ෂේත්‍ර සටහන 4හි හෙළිදරව් කොට ඇත. ඊට වත්කම් සහ බැරකම් වාර්තාකොට ඇති ප්‍රමාණ සහ මූල්‍ය වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය වත්කම් සහ බැරකම් හෙළිදරව් කිරීම සහ වාර්තාකරණ කාලසීමාව තුල ආදායම සහ වියදම් පමාණ පිළිබඳ වාර්තාව අයත් වේ. වර්තමාන සිදුවීම් සහ ක්‍රියාමාර්ග පිළිබඳ කලමනාකාරීත්වයේ උපරිම දැනුම මත මෙම ඇස්තමේන්තු පාදක වුවත්, අවසානයේදී තථ්‍ය ප්‍රතිඵල මෙම ඇස්තමේන්තුවට වඩා වෙනස් විය හැකිය.

3.1.2 අඛණ්ඩ පැවැත්ම

ප්‍රවර්තන ව්‍යාපාරයක් වශයෙන් අඛණ්ඩව පැවතීමට සමාගමට ඇති හැකියාව සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඇගයීමක් සිදු කර ඇති අතර ඈවර කිරීමට හෝ වෙළෙඳ කටයුතු නැවැත්වීමට ඔවුන් අදහස් නොකරති.

3.1.3 පශ්චාත් ශේෂ පත්‍ර සිදුවීම

ශේෂ පත්‍ර දිනයට පසුව සිදුවූ සියලු භෞතික සිදුවීම් සලකා බලා අවශ්‍ය තැන්හි දී මූල්‍ය ප්‍රකාශයන්හි ගැලපීම් සිදුකර හෝ හෙළිදරව් කිරීම් සිදුකර ඇත.

3.1.4 සංසන්දනාත්මක තොරතුරු

සංස්ථාව විසින් එකාකාරීව යොදාගෙන ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අන්‍යාකාරයෙන් සඳහන් කර ඇත්තේ නම් මිස පෙර වර්ෂයේ ප්‍රතිපත්ති සමඟ අනුරූප වේ. සලකා බලනු ලබන වර්ෂයෙහි ඉදිරිපත් කිරීම සමඟ අනුකූල වන පරිදි අවශ්‍ය ස්ථානයන්හි දී පූර්ව වර්ෂයේ සංඛ්‍යා නැවත සකස් කර ඇත.

3.1.5 විදේශ ව්‍යවහාර මුදල්

(අ) කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් ඒකකය

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර ඇති අයිතම මනිනු ලබන්නේ අස්ථිත්වය ක්‍රියාත්මක වන ප්‍රාථමික ආර්ථික පරිසරයේ මුදල් ඒකකය යොදා ගනිමිනි. (කෘත්‍යාත්මක මුදල් ඒකකය). මෙම මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලැබ ඇත්තේ සංස්ථාවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි.

(ආ) විදේශ මුදල් ගණුදෙනු සහ ශේෂයන්

විදේශ මුදල් ගණුදෙනු, එම ගණුදෙනුව සිදුකරන ලද දිනයන්හි දී පැවැති විනිමය අනුපාතය හෝ අයිතම මනිනු ලබන අවස්ථාවන්හි දී වටිනාකම යොදා ගනිමින් කෘත්‍යාත්මක මුදල් ඒකකයට පරිවර්තනය කරනු ලැබේ. එබඳු ගණුදෙනු බේරුම් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් විදේශ මුදලින් අභිධාන කර ඇති මූල්‍ය වත්කම් සහ බැරකම් වර්ෂය අවසානයේ විනිමය අනුපාතයන්ට පරිවර්තනය කිරීමේ දී ඇති වන විධේහ විනිමය ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

3.2 අනෙකුත් වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

3.2.1 වත්කම් සහ ඒවායේ තක්සේරු පදනම්

ශේෂ පත්‍රයේ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය ඇති වත්කම් වනුයේ මුදල් සහ සංස්ථාවේ ව්‍යාපාරික කටයුතු වල සාමාන්‍ය මෙහෙයුම් චක්‍රය තුල හෝ ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් තුල යන දෙකින් වඩා කෙටි කාල සීමාව තුල මුදලින් උපලබ්ධි වීමට අපේක්ෂිත දෑ වේ. ජංගම වත්කම් හැර අනෙකුත් වත්කම් වනුයේ ශේෂ පත්‍ර දිනයේ සිට එක් වසරක කාල සීමාවක් ඉක්මවා රඳවා ගැනීමට සංස්ථාව අදහස් කරන වත්කම් වේ.

3.2.1.1 දේපල, පිරියත් හා උපකරණ (PPE)

ඉඩම් සහ ගොඩනැගිලි සමන්විත වනුයේ මූලිකවම ප්‍රධාන කාර්යාලය, ප්‍රාදේශීය සහ සම්ප්‍රේෂණ මධ්‍යස්ථාන වලිනි. සියලු දේපල, පිරියත, හා උපකරණ ඓතිහාසික පිරිවැයට ප්‍රකාශ කරනු ලැබ ඇත. දේපල, පිරියත හා උපකරණ වල පිරිවැය යනු අත්කර ගැනීමේ හෝ ඉදිකිරීම් පිරිවැය සමඟින් අපේක්ෂිත පරමාර්ථය සඳහා අදාල වත්කම වැඩ කරන තත්ත්වයට ගෙන ඒම සඳහා දැරීමට සිදුවන ආනුෂංගික වියදම් ද වේ. වත්කම් වල ඉපැයුම් ධාරිතාව අඛණ්ඩව පවත්වාගෙන යාම හෝ ඉහල නැංවීම පිණිස ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීම, ව්‍යාප්ත කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා දරණ ලද ප්‍රාග්ධන වියදම් ලෙස සලකනු ලැබේ. පසුව දරණ අනෙකුත් පිරිවැය වත්කමේ ධාරණ අගයට ඇතුලත් කරනු ලබන්නේ හෝ වෙනම වත්කමක් ලෙස පිළිගනු ලබන්නේ එම අයිතමය තුල අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ මාගමට ගලා ඒමට හැකියාවක් ඇත්නම් සහ අයිතමයේ පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණි.

3.2.1.2 ප්‍රතිස්ථාපන පිරිවැය

වියදම් දරණ ලද අවස්ථාවේ දී සිදුවූ වියදමක් ලෙස හඳුනාගනු ලබන්නේ මුල් අවස්ථාවේදීම කාර්යසාධනය පිළිබඳ අගයන ලද ප්‍රමිතිය මගින් අපේක්ෂිත අනාගත ආර්ථික ප්‍රතිලාභ මගින් දේපල, පිරියත සහ උපකරණ සම්බන්ධයෙන් ඇති වන අළුත්වැඩියා හෝ නඩත්තුව මත ඇතිවන වියදම් වේ.

3.2.1.3 ක්ෂය වීම්

ඉඩම් ක්ෂය කිරීමක් සිදු නොවේ. ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන ගණනය කර ඇත්තේ සියලු දේපල, පිරියත් සහ උපකරණ වල පිරිවැය හෝ තක්සේරුව මත සරල රේඛීය පදනම යොදා ගනිමිනි. මේ සඳහා යොදාගත් ප්‍රධාන වාර්ෂික අනුපාත වනුයේ

ගොඩනැගිලි	2.5%
පිරියත හා යන්ත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහ භාණ්ඩ, සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
මෝටර් රථ වාහන	25%
සංගීත භාණ්ඩ	10%
පරිගනක උපකරණ	50%
පටිගත කිරීමේ පටි	33.33%
සුළු උපකරණ	50%
මෘදුකාංග	50%

සෑම ගිණුම්කරණ වාර්තාකරණ කාලසීමාවක් අවසානයේදීම, වත්කමේ අවශේෂ වටිනාකම් සහ ප්‍රයෝජ්‍ය ආයු කාලය උචිත පරිදි සමාලෝචනයකට ලක් කොට ගැලපීම් සිදු කෙරේ.

වත්කමක ධාරණ මුදල එහි ඇස්තමේන්තුගත අයකර ගත හැකි මුදලට වඩා වැඩි වන්නේ නම්,

දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම මත ලාභය හෝ අලාභය නිශ්චය කරනු ලබන්නේ ඒවායේ ධාරණ වටිනාකමට සාපේක්ෂව වන අතර මෙහෙයුම් ලාභය නිශ්චය කිරීමේදී එය සැලකිල්ලට ගනු ලැබේ. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කම් විකුණන විට දී, අනෙකුත් සංචිත වල ඇතුලත් කර ඇති වටිනාකම් රඳවාගත් ඉපැයුම් වලට මාරුකරනු ලැබේ.

3.2.2 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ යනු වත්කමක් ඉදි කිරීමකට සෘජුවම ආශ්‍රිත ද්‍රව්‍යමය පිරිවැය සහ අනෙකුත් පිරිවැය වේ. නොනිමි වැඩ සැලකිය යුතු මට්ටමකට සම්පූර්ණ කරනු ලැබූ විට දී සහ එහි අපේක්ෂිත භාවිතය සහා සූදානම් විටදී අදාල වත්කම් ගිණුම්වලට මාරුකරනු ලැබේ.

3.2.3 මූල්‍ය වත්කම්

3.2.3.1. වර්ගීකරණය

3.2.3.2 ණය සහ ලැබිය යුතු දෑ

ණය සහ ලැබිය යුතු දෑ සක්‍රීය වෙළෙඳපොලක මිල ගණන් ඉදිරිපත් කර නොමැති ස්ථාවර සහ නිශ්චයනීය ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. වාර්තාකරණ කාල සීමාව අවසානයේදී මාස 12කට වඩා වැඩි කල්පිරීම් සඳහා හැරුණු විට, ඒවා ජංගම වත්කම් හි ඇතුලත් කරනු ලැබේ. මේවා ජංගම නොවන වත්කම් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සමාගමේ ණය සහ ලැබිය යුතු දෑ ශේෂ පත්‍රයේ "වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ" සහ "මුදල් සහ මුදල් සමාන දේ" වලින් සමන්විත වේ. (සටහන් 13 සහ 14)

3.2.5.4. පිළිගැනීම සහ මැනීම

ලාභ හෝ පාඩු හරහා සාධාරණ වටිනාකමට දැක්වෙන මූල්‍ය වත්කම් ආරම්භයේදී සාධාරණ වටිනාකමට පිළිගනු ලබන අතර ගණුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හිලව් කොට දකවනු ලැබේ. ආයෝජන වලින් මුදල් ප්‍රවාහ ලැබීමේ අයිතිය අවසන් වී ඇති විටදී හෝ හිමිකාරීත්වයේ සියලු අවදානම් සහ පරිදාන සැලකිය යුතු ලෙස පවරනු ලැබ ඇති විටදී මූල්‍ය වත්කම් පිළිගැනීම අවසන් කරනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් සහ ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම් පසුව සාධාරණ වටිනාකමට දක්වනු ලැබේ.

සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ණය සහ ලැබිය යුතු දෑ පසුව ක්‍රම ක්ෂය කරන ලද මිලට දක්වනු ලැබේ. "ලාභ හෝ අලාභ හරහා සාධාරණ වටිනාකමට දක්වා ඇති මූල්‍ය වත්කම්" බාණ්ඩයේ සාධාරණ වටිනාකමේ වෙනස්වීම් වලින් මතුවන ලාභ හෝ අලාභ ඒවා මතුවන කාල සීමාව තුල "අනෙකුත් (අලාභ) / ලාභ - ශුද්ධ" හි ආදායම් ප්‍රකාශයේ ඉදිරිපත් කරනු ලැබේ.

අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති මුදල් හෝ මුදල් නොවන සුරුකුම්පත් වල සාධාරණ වටිනාකමේ වෙනස්වීම් අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ. අලෙවියට තිබෙන මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇති සුරුකුම්පත් විකුණනු ලබන විටදී හෝ හානි වූ විටදී, ස්කන්ධයේ පිළිගනු ලබන සමුච්චිත සාධාරණ වටිනාකමේ ගැලපීම් "ආයෝජන සුරුකුම්පත් වලින් ලාභ හෝ අලාභ" ලෙස ආදායම් ප්‍රතාශයේ ඇතුලත් කරනු ලැබේ. සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ගණනය කරනු ලබන අලෙවියට තිබෙන සුරුකුම්පත් මත පොළිය අනෙකුත් ආදායමේ කොටසක් ලෙස ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

3.2.5.5 මූල්‍ය වත්කම් හානි

(අ) ක්‍රම ක්ෂය පිරිවැයට දැක්වෙන වත්කම්

සෑම වාර්තාකරණ කාල සීමාවක් අවසානයේදී ම මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානී වීමේ වාස්තවික සාක්ෂි ඇත්දැ යි යන්න සංස්ථාව තක්සේරු කරයි. මූල්‍ය වත්කමක් හෝ මූල්‍ය වත්කම් සමූහයක් හානි වී, හානි අලාභ දැරීමට සිදු වනුයේ වත්කම් ආරම්භක පිළිගැනීමෙන් පසුව සිදුවන තනි හෝ බොහෝ සිද්ධීන් හි (හානි සිද්ධියක්) ප්‍රතිඵලයක් ලෙස හානි සිදු වී ඇති බවට වාස්තවික සාක්ෂි ඇත්නම් සහ එම හානි සිද්ධිය (හෝ සිද්ධි) මූල්‍ය වත්කමෙහි හෝ මූල්‍ය වත්කම් සමූහයෙහි ඇස්තමේන්තුගත අනුගත මුදල් ප්‍රවාහයන්ට විශ්වාසනීය ලෙස මිනිය හැකි බලපෑමක් ඇති කරන්නේ නම් පමණි.

ණය හිමියෝ හෝ ණය හිමි සමූහයක් සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතා අත්විඳින බවට වන ඇඟවීම්, ඔවුන් වස්තු භංගත්වයට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිසංවිධානයක් සඳහා එළැඹීමේ සම්භාවිතාව සහ පැහැර හැරීම හා සහ සම්බන්ධ වන නිග මුදල් වෙනස්කම් හෝ ආර්ථික තත්ත්වයන් බදු ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි මිනිය හැකි අඩුවීමක් තිබෙන බවට නිරීක්ෂණය කළ හැකි දත්ත පෙන්නුම් කිරීම ආදිය හානි පිළිබඳ සාක්ෂිවලට ඇතුලත් විය හැකිය.

"ණය සහ ලැබිය යුතු දැ" ඛාණ්ඩය සඳහා, හානියේ ප්‍රමාණය මනිනු ලබන්නේ වත්කමෙහි ධාරණ මුදල සහ මූල්‍ය වත්කමෙහි මුල් සඵල පොළී අනුපාතයට වට්ටම් කරන ලද ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහයන්හි (දැරීමට සිදුව නොමැති අනාගත ණය අලාභ හැර) වත්මන් වටිනාකම අතර වෙනස ලෙසයි. ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ වත්කමෙහි ධාරණ මුදල අඩුකර අලාභයේ ප්‍රාණය පිළිගනු ලැබේ. යම් ණයක හෝ කල් පිරීම දක්වා රඳවා ගත් ආයෝජනයක විචල්‍ය ණය අනුපාතයක් තිබේ නම්, කිසියම් හානි අලාභ මැනීම සඳහා වට්ටම් අනුපාතය වනුයේ ගිවිසුම යටතේ නිශ්චය කර ඇති වත්මනෙහි ක්‍රියාත්මක පොළී අනුපාතයයි. ප්‍රායෝගික ක්‍රියාමාර්ගයක් ලෙස, නිරීක්ෂණය කළ හැකි වෙළෙඳපොල මිලක් යොදා ගනිමින් සාධන පත්‍රක සාධාරණ වටිනාකම් පාදකව සංස්ථාව හානිය මැනීමට ඉඩ තිබේ.

පසුව එළැඹෙන කාල සීමාවකදී, හානියෙන් සිදුවූ අලාභයේ ප්‍රමාණය අඩුවී එම අඩුවීම හානි වීම පිළිගැනීමෙන් පසු සිදුවූ සිද්ධියකට වාස්තවිකව සම්බන්ධ වන්නේ නම් (ණය හිමියාගේ ණය ප්‍රමාණ කිරීම වැඩි දියුණු වීමක් බඳු), කළින් පිලිගත් හානි වීමේ අලාභය ප්‍රතිවර්තනය ආදායම් ප්‍රකාශයෙහි පිළිගනු ලැබේ.

3.2.5.6 වෙළෙඳ ලැබිය යුතු

වෙළෙඳ ලැබිය යුතු දෑ අපේක්ෂිත උපලබ්ධි කළ හැකි වටිනාකමට දක්වනු ලැබේ. ලැබිය යුතු දෑ පිලිබඳ මුල් නියමයන් ප්‍රකාරව අයවිය යුතු සියලු මුදල් ප්‍රාණ සංස්ථාවට එකතු කර ගැනීමට නොහැකි විය හැකි බවට වාස්තවික සාක්ෂි ඇති විටදී වෙළෙඳ අයවිය යුතු දේවල් වල හානි වීම් සඳහා ප්‍රතිපාදනයක් ස්ථාපිත කෙරේ. ණය ගැතියා මුහුණ දෙන සැලකිය යුතු මුළ්‍ය දුෂ්කරතා, ණය ගැතියා බුන්වත් බවට පත්වීම හෝ මූල්‍ය ප්‍රති සංවිධානය සඳහා ඇති ඉඩකඩ ආදිය වෙළෙඳ ලැබිය යුතු දෑ දුර්වල වී ඇති බවට දර්ශකයක් වශයෙන් සලකනු ලැබේ. දීමනා ගිණුමක් භාවිතා කිරීම මගින්

වත්කමේ ධාරණ වියදම අඩුකරනු ලබන අතර විස්තීරණ ආදායම් ප්‍රකාශයේ බෙදාහැරීමේ පිරිවැය තුල පාඩු මුදල පිළිගනු ලැබේ. වෙළෙඳ ලැබීමක් එකතු කරගත නොහැකි වන විට ලැබිය යුතු වෙළෙඳ මුදල් සඳහා දීමනා ගිණුමෙන් එය කපා හරිනු ලැබේ.

කළින් කපා හරින ලද මුදල් පසුව එකතු කර ගැනීම් විස්ථීර්ණ ආදායම් ප්‍රකාශයේ බෙදා හැරීමේ පිරිවැයට බාරකරනු ලැබේ.

වෙළෙඳ ලැබිය යුතු දෑ ආරම්භයේ දී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් පසුව ඒවා හැනිවීම සඳහා වන ප්‍රතිපාදන අඩු කිරීමෙන් පසු සඵල පොළී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

3.2.6 ඉන්වෙන්ට්‍රිගත තොග

වට්ටෝරු භාණ්ඩ ප්‍රකාශ කර ඇත්තේ වඩා අඩු පිරිවැයට හෝ ශුද්ධ උපලබ්ධි කළ අගයටය. ශුද්ධ උපලබ්ධි කළ අගය යනු සාමාන්‍ය ව්‍යාපාරික ඇස්තමෙන්තුගත සම්පූර්ණ කිරීමේ සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් පසු ඇස්තමේන්තුගත විකුණුම් මිලය.

3.2.7 මුදල් සහ මුදලට සමාන දෑ

මුදල් ප්‍රවාහ පිළිබඳ ඒකාබද්ධ ප්‍රකාශයන්හි, මුදල් හා මුදලට සමාන දෑ ට අතැති මුදල්, බැංකු වල ඇති ඉල්ලුම් තැන්පතු මාස තුනක් හෝ ඊට අඩු මුලික කල්පිරීමක් සහිත අනෙකුත් කෙටි කාලීන ඉහල ද්‍රවශීලතාවක් ඇති ආයෝජන සහ බැංකු අයිරා අයත් වේ. මූල්‍ය තත්ත්වය පිළිබ ප්‍රකාශයේ බැංකු අයිරා පෙන්නුම් කරනු ලබන්නේ ජංගම වගකීම් තුල ණය ගැණුම් ලෙසය.

3.2.8 ණය ගැණුම් පිරිවැය

ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සූදානම් කිරීම සඳහා සැලකිය යුතු කාල සීමාවක් ගන්නා වත්කම් ලෙස සුදුසුකම් ලබන වත්කම් අත්පත් කර ගැනීම, ඉදිකිරීම හෝ නිශ්පාදනය වෙත සෘජුවම ආරෝපනය සාමාන්‍ය හෝ නිශ්චිත ණය ගැණුම් පිරිවැය, එකී වත්කම් ඒවායේ අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට සාරානුකූලව සූදානම් කරන කාලය තෙක් එම වත්කම් වල පිරිවැයට එකතු කරනු ලැබේ.

නිශ්චිත ණය ගැණුම් වල තාවකාලික ආයෝජන මත උපයනු ලැබූ ආයෝජන ආදායම, සුදුසුකම් ලබන වත්කම් මත ඒවායේ වියදම තීරණය කරන තෙක් ප්‍රාග්ධනීකරණය සඳහා සුදුසුකම් ඇති ණය ගැණුම් පිරිවැයෙන් අඩු කරනු ලැබේ.

අනෙකුත් සියලු ණය ගැනීමේ පිරිවැය ඒවා දරණ ලද කාල සීමාව තුල ලාභ හෝ අලාභයන් හි පිළිගනු ලැබේ.

3.2.9 ජංගම සහ විලම්භීත බදු

අදාල කාල සීමාව සඳහා බදු වියදම ජංගම සහ විලම්භීත බදු වලින් සමන්විත වේ. ආදායම් ප්‍රකාශය තුල බදු පිළිගනු ලබන්නේ අනෙකුත් විස්තීර්ණ ආදායම් වල හෝ කෙළින්ම කොටස් වල ගණන් ගනු ලබන අයිතම වලට ඒවා අදාල වන ප්‍රමාණයට හැර ඉතිරි ප්‍රමාණයටය. උක්ත කී ආකාරයට අනෙකුත් විස්තීර්ණ ආදායම් වල හෝ කෙළින්ම කොටස් වල ද බදු ගණන් ගැනේ.

අ) ජංගම බදුකරණය

2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන අනුව සමාගමට ජංගම බදු බැරකම් ඇතිවේ. සැබෑ බැරකම් පිළිබිඹු කරන්නක් වශයෙන් කලමනාකාරීත්වය විශ්වාස කරන යථෝක්ත ප්‍රතිපාදන යොදා ගනිමින් මූල්‍ය ප්‍රකාශ වල මේ බැරකම් සහා ප්‍රතිපාදන සපයනු ලැබේ. ගණුදෙනු පිළිබඳව සංස්ථාව විසින් ගනු ලැබූ ස්ථාවරය ආදායම් අධිකාරීන් විසින් අභියෝගයට ලක් කරන අවස්ථා තිබිය හැකිය. මෙම කරුණු නිසා ඇතිවන කවර හෝ අතිරේක පිරිවැයක් සංස්ථාව මත බැරකම තහවුරු කරන අවස්ථාවේ බදු වියදමක් ලෙස ගිණුම්ගත කරනු ලැබේ.

සලකා බලන වර්ෂය සහ කාල සීමාවන් සඳහා ජංගම බදු වත්කම් සහ බැරකම් මනිනු ලබන්නේ ආදායම් අධිකාරියට ආපසු අයකර ගැනීමට හෝ ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණයන්ගෙනි. ප්‍රමාණය ගණනය කිරීම සඳහා භාවිතා කළ බදු අනුපාත හෝ බදු නීති වනුයේ ශේෂ පත්‍ර දිනය වන විට පනවනු ලබන හෝ සැලකිය යුතු ලෙස පනවනු ලබන ඒවාය. ජංගම බදු සඳහා ප්‍රතිපාදන පදනම් වනුයේ මූල්‍ය ප්‍රකාශයන් හි වාර්තාකර ඇති පරිදි ආදායම් සහ වියදම් අංග පදනම් කර ගනිමිනි.

ආ) විලම්භීත බදු

වත්කම් සහ බැරකම් වල බදු පදනම සහ මූල්‍ය වාර්තාකරණ කාර්යයන් සඳහා ඒවායේ ධාරණ වටිනාකම අතර ශේෂපත්‍ර දිනට ඇති තාවකාලික වෙනස්කම් මත බැරකම් ක්‍රමවේදය භාවිතා කරමින් විලම්භීත බදු පිළිගනු ලැබේ. ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ ගිණුම්කරණයට හෝ බදු අයකළ හැකි ලාභයට බල නොපාන ගනුදෙනුවක දී වත්කම් සහ බැරකම් ආරම්භක පිළිගැනීමෙන් මතුවන තාවකාලික වෙනස්කම් සහ පූර්ව අපේක්ෂිත අනාගතයේ ප්‍රවර්තනය නොවීමට ඉඩ ඇති ප්‍රමාණයට ආයෝජන ආශ්‍රිත වෙනස්කම් සඳහා විලම්භීත බදු බැරකම් පිළිගනු නොලැබේ. ඊට අමතරව, කීර්තිනාමය ආරම්භක පිළිගැනීම මත මතුවන බදු අයකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ද විලම්භීත බදු බැරකම් පිළිගනු නොලැබේ. වාර්තාකරණ දිනය වන විට පනවා ඇති හෝ සැලකිය යුතු ලෙස පැනවීමට ඉඩ ඇති නීති මත පදනම්ව තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය වන විට දී යොදා ගැනීමට අපේක්ෂා කරනු ලබන බදු අනුපාතයන්ට විලම්භීත බදු ගණනය කෙරේ. ජංගම බදු බැරකම් සහ වත්කම් හිලව් කිරීම පිණිස නෛතිකව බලාත්මක කළ යුතු හිමිකමක් වේ නම්, සහ එම බදු අයකළ හැක අස්ථිත්වයට එහි බදු අධිකාරීන් විසින් ම අයකරනු ලබන ආදායම් බදු වලට ඒවා අදාල වන්නේ නම් විලම්භීත බදු වත්කම් සහ බැරකම් හිලව් කරනු ලැබේ.

විලම්භීත බදු වත්කම් පිළිගනු ලබන්නේ තාවකාලික වෙනස්කම් උපයෝජනය සඳහා යොදාගත හැකි අනාගත බදු අයකළ හැකි ලාභ ඇතිවිය හැකිතාක් දුරට පමණි. එක් එක් වාර්තාකරණ දිනයට විලම්භීත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර ආශ්‍රිත බදු ප්‍රතිලාභ උපලබ්ධි වීම තවදුරටත් සිදු නොවිය හැකි ප්‍රමාණයට අඩු කරනු ලැබේ.

3.2.10 සේවක ප්‍රතිලාභ

3.2.10.1 විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්

අ) නිර්වචිත ප්‍රතිලාභ සැලැස්ම - විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිපාදනය

නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මක් යනු නිර්වචිත දායක සැලැස්මක් හැරුණු කොට පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලැස්මකි. නිර්වචිත ප්‍රතිලාභ සැලැස්මට අදාලව මූල්‍ය ප්‍රකාශනයේ පිළිගනු ලබන බැරකම වාර්තාකරණ දිනයට නිර්වචිත බැදීමේ වත්මන් වටිනාකමය. නිර්වචිත ප්‍රතිලාභ බැදීමේ වත්මන් වටිනාකම් නිර්ණය කරනු ලබන්නේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ගලායාම වට්ටම් කිරීම මගිනි.

ප්‍රතිලාභ ගෙවනු ලබන මුදල් ඒකකයන් හි සහ ආශ්‍රිත බැරකමේ කාල සීමාවන්ට සමීප වන්නා වූ කල්පිරීමේ කාලසීමා සහිත පොළී අනුපාත භාවිතා කරමින් ප්‍රතිලාභ ගෙවනු ලැබේ.

විශ්‍රාමික ප්‍රතිලාභ පිරිවැය පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිති අංක 16 (2006 ප්‍රතිශෝධිත) අනුකූල වන පරිදි සියලු ස්ථිර සේවකයන් සඳහා සේවයේ පලමු වසර සම්පූර්ණ කිරීමේ සිට විශ්‍රාමික පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන සලසා ඇත. කෙසේ වෙතත්, 1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීම් පනත සමග සේවකයකු සඳහා වන වගකීම ඇති වනුයේ පස් වසරක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමේදී පමණි. බැරකම් සඳහා බාහිරින් අරමුදල් සපයනු නොලැබේ.

මෙම බැරකම සඳහා බාහිරින් අරමුදල් සපයා ගනු නොලැබේ. කලමනාකරණය විසින් සලකා බලනු ලබන ආයු ගණකයේ ප්‍රධාන උපකල්පනයන්ට පහත දැ ඇතුලත් වේ,

01. පොළී අනුපාතය 11.88%

02. වැටුප් වර්ධක අනුපාතය 3%

03. සියලු සේවකයන්ගේ විශ්‍රාම ගන්නා වයස් සීමාව අවුරුදු 60කි

04. කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය

ආ) නිර්වචිත දායක සැලසුම් - "සේවක අර්ථසාධක අරමුදල" සහ "සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල"

"සේවක අර්ථසාධක අරමුදලේ" සහ "සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ" දායක මුදල් සඳහා හිමිකම් ලබා ඇති සියලුම සේවකයන් ඒ ඒ ප්‍රඥප්ති සහ රෙගුලාසි ප්‍රකාරව අදාල දායක අරමුදල් වලින් ආවරණය කෙරේ. නිර්වචිත දායක සැලසුම් සඳහා මුදල් දරණ ලද අවස්ථාවේ දී ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනා ගැනේ.

3.2.11 රජයේ ප්‍රදාන

ප්‍රදානයට අදාල කොන්දේසි වලට සංස්ථාව අනුකූල වන බවට සහ ප්‍රදානය ලැබෙන බවට සාධාරණ සහතිකයක් ඇතිනම් රජයේ ප්‍රදාන ඒවායේ සාධාරණ වටිනාකමට පිළිගනු ලැබේ.

පිරිවැයට අදාල රජයේ ප්‍රදාන විලම්භනය කරනු ලබන අතර හානි පූර්ණය කිරීමට අපේක්ෂා කරන පිරිවැය සම ඒවා ගැලපීම පිණිස අවශ්‍ය කාල සීමාව මුළුල්ලේම විස්තීරණ ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

දේපල, පිරියත සහ අපකරණ සහ ජීව විද්‍යාත්මක වත්කම් වලට අදාල ප්‍රදාන විලම්භිත ආදායමක් ලෙස ජංගම නොවන වගකීම් වල ඇතුලත් කරනු ලබන අතර ආශ්‍රිත වත්කම් වල අපේක්ෂිත ආයු කාලය පුරා සරල රේඛීය පදනමක් මත ආදායම් ප්‍රකාශයට බැර කරනු ලැබේ.

ක්‍රම ක්ෂය අනුපාත පහත පරිදි වේ,

ගොඩනැගිලි	2.5%
පිරියත හා යන්ත්‍ර	7.5%
ශ්‍රව්‍ය සංඛ්‍යාත උපකරණ	7.5%
ගෘහ භාණ්ඩ සවිකිරීම් සහ උපකරණ	10%
සම්ප්‍රේෂක	7.5%
මෝටර් රථ වාහන	25%
පරිගනක උපකරණ	50%
මෘදුකාංග	50%

3.2.12 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වත්මන් නෛතික හෝ සම්මුතික බැඳීමක් සංස්ථාව සතුව ඇති විටකදී, එකී බැඳීම පියවනු වස් ආර්ථික ප්‍රතිලාභ හුවා දක්වමින් සම්පත් ගලා යාමක් අවශ්‍ය වන විටකදී සහ බැඳීමේ වටිනාකමට විශ්වාසනීය ඇස්තමේන්තුවක් සිදුකළ හැකි වන විට ප්‍රතිපාදන හඳුනාගනු ඇත.

3.2.13 අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්

අම්භාව්‍ය බැරකමක් යනු සංස්ථාවේ පාලනයෙන් බැහැර වන අවිනිශ්චිත අනාගත සිදුවීම් එකක් හෝ කිහිපයක් ක්‍රියාත්මක වීම හෝ ක්‍රියාත්මක නොවීම මගින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම් වලින් හෝ එකී බැඳීම් වලින් නිදහස් වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදු වීම සඳහා සම්පත් බැහැරට ගලා යාමක් සිදුවීමේ ශක්‍යතාවක් නොමැති බැවින් නොපිළිගැනෙන වර්තමාන බැඳීමකින් හෝ උද්ගත වීමට හැකියාවක් ඇති බැඳීමකි. විශ්වාසනීය ලෙස මැනිය නොහැකි බැරකමක් පවතින බෙහෙවින් දුර්ලභ අවස්ථාවන් හි දී ද බැරකමක් හඳුනා නොගන්නා නමුදු එවැන්ක පැවැත්ම මූල්‍ය ප්‍රකාශ වලින් අනාවරණය කරයි.

අසම්භාව්‍ය වත්කමක් යනු සංස්ථාවේ පාලනයෙන් පරිබාහිර අවනිශ්චිත අනාගත සිදුවීම් වලින් පැන නැගිය හැකි වැඩි සංඛ්‍යාවක් ඇති වීමකින් සිය පැවැත්ම සනාථ වන අතීත සිදුවීම් වලින් පැන නැගීමට ඉඩ ඇති වත්කමකි. සංස්ථාව අවිනිශ්චිත වත්කම් හඳුනා නොගන්නා නමුදු ආර්ථික ප්‍රතිලාභ ඇතුලට ගලා ඒම් සිදුවිය හැකි වුවත් එය සැබැවින්ම ස්ථීර නොවන අවස්ථා වලදී එවැනි දේවල් වල පැවැත්ම අනාවරණය කරයි.

3.2.14 වෙළෙඳ ගෙවිය යුතු දෑ

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී සැපයුම්කරුවන්ගෙන් ලබාගන්නා ලද භාණ්ඩ හෝ සේවා වෙනුවෙන් ගෙවීම් කිරීමට ඇති බැඳීම් ය. ගෙවීම් කළ යුතු වන්නේ වසරක් තුල හෝ ඊට අඩු කාලයක් තුල නම් (හෝ ඊට වඩා කාලය දිගු වන්නේ නම් ව්‍යාපාරයේ සාමාන්‍ය වෙහෙයුම් චක්‍ර තුලදී) ගෙවිය යුතු ගිණුම් ජංගම බැරකමක් වශයෙන් වර්ගීකරණය කරනු ලැබේ.

වෙළෙඳ ගෙවිය යුතු දෑ ආරම්භයේදී සාධාරණ අගයට පිළිගනු ලබන අතර ඉන් අනතුරුව සළුල පොලී ක්‍රමවේදය භාවිතා කරමින් ක්‍රම ක්ෂය පිරිවැයට මනිනු ලැබේ.

3.2.15 මූල්‍ය කල්බදු බැඳීම්

කල්බදු ගත් අයිතම වල හිමිකමට ආනුෂංගික සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස සංස්ථාවට පවරන්න වූ මූල්‍ය කල්බදු මත ලබාගත් දේපල, පිරියත හා උපකරණ අදාල කල්බදු ආරම්භයේදී කල්බදු ගත් දේපලේ සාධාරණ වටිනාකමට හෝ වඩා අඩු නම් සමුච්චිත ක්ෂය වීම අඩුකොට ආරම්භයේදී අවම කල්බදු ගෙවීමේ වටිනාකමේ වර්තමාන අගයට ප්‍රාග්ධනායිත කරනු ලැබේ.

ගෙවිය යුතු මුළු පොළිය අවිනිශ්චිත පොළියක් සේ ගිණුම්ගත කරනු ලැබේ. අනුරූපී ණය බදු දීමනාකරුට ගෙවිය යුතු ණය මුදලක් සේ වාර්තා කරනු ලැබේ. ගෙවන ලද වාරික බැරකම අඩු කිරීම සඳහා යොදා ගනු ලැබේ.

වර්ෂයට අය කරන පොළිය පොළී සඳහා වන අවිනිශ්චිත ගිණුමෙන් ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ.

3.2.16 ආදායම් ප්‍රකාශනය

3.2.16.1 ආදායම පිළිගැනීම

ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිශ්ධාවේ සාධාරණ වටිනාකමට අනුව ආදායම ගණනය කිරීම සිදු කරනු ලබන අතර සපයන ලද සේවා වෙනුවෙන් ලැබිය යුතු මුදල් ප්‍රමාණ පෙන්නුම් කරන අතර වට්ටම් සහ වටිනාකම එකතු කළ බදු අඩුකොට සඳහන් කරනු ලැබේ. ආදායම් ප්‍රමාණ විශ්වසනීය ලෙස ගණනය කළ හැකි විටකදී, අනාගත ආර්ථික ප්‍රතිලාභ සංස්ථාව වෙත ප්‍රවාහය වීමට ප්‍රස්ථාව ඇති විට දී සහ සංස්ථාවේ එක් එක් ක්‍රියාකාරකම සඳහා නිශ්චිත නිර්ණායක සපුරා ඇති විට දී සංස්ථාව ආදායම පිළිගනී. පහත විස්තර කර ඇති පරිදි, ගණුදෙනුකරුගේ ස්වරූපය, ගනුදෙණු වර්ගය සහ එක් එක් සැකැස්මේ නිශ්චිත තොරතුරු සැලකිල්ලට ගනිමින් සංස්ථාව සිය ප්‍රතිලාභ ඇස්තමේන්තු ඓතිහාසික ප්‍රතිඵල මත පදනම් කර ගනී.

(අ) ගුවන් කාලය අලෙවි කිරීම

ගුවන් කාලය විකිණීමෙන් ලබන මුදලින් ආදායම සමන්විත වේ. වෙළෙඳ දැන්වීම් ප්‍රචාරය වන ගුවන් කාලය විකිණීමෙන් ලබන ආදායම මෙසේ පිළිගනු ලැබේ.

(ආ) පොළී ආදායම

එකතුකර ගැනීමට හැකි බව පිළිබඳව සැකයක් අත්තේ නම් මිස කාල පදනමින් උපචිත වූ පොළිය (වත්කමේ සඵල ඵලදාව සැලකිල්ලට ගනිමින්) පොළී ආදායම ලෙස පිළිගනු ලැබේ.

(ඇ) දේපල, පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලැබීම් සහ අලාභ

දේපල පිරියත හා උපකරණ බැහැර කිරීම් මත ශුද්ධ ලාභ සහ අලාභ නිර්ණය කරනු ලබන්නේ ශුද්ධ විකුණුම් මුදල් දේපල, පිරියත හා උපකරණ වල ධාරණ වටිනාකම සැසඳීමෙන් වන අතර ආදායම් ප්‍රකාශයේ පිළිගනු ලැබේ.

(ඈ) වෙනත් ආදායම්

අන් සියලු ආදායම් පිළිගනු ලබන්නේ උපචිත පදනම මතයි.

3.2.17.1 වියදම් පිළිගැනුම

අ) මෙහෙයුම් වියදම්

ආදායම් ප්‍රකාශයේ වියදම් පිළිගනු ලබන්නේ දරණ ලද පිරිවැය සහ නිශ්චිත ආදායම් අයිතම අතර සෘජු සබඳතා පදනම මතය. ව්‍යාපාරය පවත්වා ගෙන යාමේදී සහ කාර්යක්ෂම තත්ත්වයක් තුල දේපල, පිරියත, සහ උපකරණ නඩත්තු කිරීමේදී දරනු ලබන සියලු වියදම් වර්ෂයේ ලාභ / (පාඩු) නිගමනය කිරීමේදී ආදායමෙන් අඩු කරනු ලැබ ඇත. බොල් සහ අඩමාන ණය, දන්නා දියලු බැරකම් සහ දේපල, පිරියත හා උපකරණ මත ක්ෂයවීම් සඳහාද ප්‍රතිපාදන සලසා ඇත.

ආ) මූල්‍ය වියදම්

පොළී ආදායම් උපචිත පදනමකින් පිළිගනු ලැබේ. ණය ගැණුම් පිරිවැය ඒවා දරණ ලද කාලසීමාවේ දී වියදමක් ලෙස පිළිගනු ලැබේ.

3.2.18 තුලනාත්මක සංඛ්‍යා

අවශ්‍ය අවස්ථාවලදී ප්‍රවර්තන වර්ෂය තුල කරනු ලබන ඉදිරිපත් කිරීම් වලට අනුකූල වනු පිණිස තුලනාත්මක සංඛ්‍යා ගලපනු ලැබ ඇත.

4. තීරණාත්මක ගිණුම්කරණ ඇස්තමේන්තු සහ විනිශ්චයන්

සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී, ආදායම්, වියදම්, වත්කම් සහ බැරකම් වල වාර්තාකර ඇති සංඛ්‍යා සහ වාර්තාකරණ දිනයට අසම්භාව්‍ය බැරකම් හෙළිදරව් කිරීම් කෙරෙහි බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමට කලමනාකාරීත්වයට සිදුවේ. කෙසේ වෙතත් මෙම උපකල්පන සහ ඇස්තමේන්තු පිළිබඳ අවිනිශ්චිත බව, අනාගත කාල සිමාවන් හි සිදු කරනු ලබන වත්කම් හෝ බැරකම් වල ධාරණ වටිනාකමට ද්‍රව්‍යමය වෙනස්කම් අවශ්‍ය කරන්නා වූ ප්‍රතිඵල ඇති කිරීමට හැකිය.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු ඓතිහාසික අත්දැකීම් සහ අනෙකුත් මූලාශ්‍රයන්ගෙන් පහසුවෙන් හඳුනාගත නොහැකි වත්කම්, බැරකම් සහ අසම්භාව්‍ය බැරකම් වල ධාරණ ප්‍රමාණ සම්බන්ධයෙන් විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පන සිදු කිරීමේ දී පදනම සකස් කරන්නා වූ අවස්ථානුකූල තත්ත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කරනු ලබන අනෙකුත් විවිධ සාධක වල ප්‍රතිඵල මත පදනම් වී ඇත.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ පාදක වූ ඇස්තමේන්තු අඛණ්ඩ පදනමකින් සමාලෝචනය කරනු ලැබේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා ප්‍රතිශෝධන, එකී ප්‍රතිශෝධන වර්තමාන සහ අනාගත කාල සීමාවන් සඳහා බලපාන්නේ නම් එම ඇස්තමේන්තු ප්‍රතිශෝධනය කරනු ලබන කාල සීමාවේදී පිළිගනු ලැබේ. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිතා කිරීමේ දී කලමනාකාරීත්වය විසින් සිදුකරන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ ඇස්තමේන්තු මූල්‍ය ප්‍රකාශ කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකිය.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ

විශ්‍රාම බැඳීම් වල වර්තමාන වටිනාකම උපකල්පන ගණනාවක් භාවිතා කරමින් ආයු ගණක පදනමක් මත නිර්ණය කරනු ලබන සාධක ගණනාවක් මත රඳා පවතී. විශ්‍රාම වැටුප් සඳහා ශුද්ධ පිරිවැය (ආදායම) නිශ්චය කිරීමේ දී යොදාගනු ලබන උපකල්පන වලට වට්ටම් අනුපාතය ඇතුලත් වේ. මෙම උපකල්පනයන්හි කවර හෝ වෙනසක් විශ්‍රාම වැටුප් බැඳීම්වල ධාරණ මුදල් ප්‍රමාණය කෙරෙහි බලපානු ඇත.

යෝග්‍ය වට්ටම් අනුපාතය සෑම වසරක් අවසානයේදීම සංස්ථාව නිශ්චය කරනු ලැබේ. විශ්‍රාම වැටුප් බැඳීම් පියවීමට අවශ්‍ය යැයි අපේක්ෂා කරනු ලබන අනාගත මුදල් ගලා යාම් වල වර්තමාන වටිනාකම නිශ්චය කිරීම සඳහා භාවිතා කළ යුතු පොළී අනුපාතය වන්නේ මෙයයි. යෝග්‍ය වට්ටම් අනුපාතය නිශ්චය කිරීමේදී සංස්ථාව ආයතනික බැඳුම්කර වල පොළී අනුපාත සැලකිල්ලට ගනියි. විශ්‍රාම වැටුප් බැඳීම් අනෙකුත් ප්‍රධාන උපකල්පන වත්මන් වෙළෙඳපොල තත්ත්වයන් මත ද අර්ධ වශයෙන් පාදක වේ.

(ආ) ආදායම් බදු

සංස්ථාව ආදායම් බදු වලට යටත් වේ. ආදායම් බදු සඳහා ප්‍රතිපාදනය නිශ්චය කිරීමේදී සැලකිය යුතු විනිශ්චයක් අවශ්‍ය වේ. බොහෝ ගණුදෙනු සහ ගණනය කිරීම් ඇති අතර ඒ සඳහා අවසාන බදු නිශ්චය කිරීම අවිනිශ්චිතය. අතිරේක බදු ලැබීමට නියමිත ද යන්න පිළිබඳ ඇස්තමේන්තු මත පාදකව අපේක්ෂිත බදු විගණන ගැටළු සඳහා සංස්ථාව බැරකම් පිළිගනු ලැබේ. මෙම කරුණුවල අවසාන බදු ප්‍රතිඵලය ආරම්භයේදී වාර්තා කළ ප්‍රමාණයන්ට වඩා වෙනස්වන විට දී, එම වෙනස්කම් එවැනි නිශ්චය කිරීම් සිදුකරනු ලැබූ කාලසීමාව තුල ජංගම සහ විලම්භිත ආදායම් බදු වත්කම් සහ බැරකම් කෙරෙහි බලපානු ඇත.

5. මූල්‍ය අවදානම් කලමනාකරණය

5.1 මූල්‍ය අවදානම් සාධක

සංස්ථාවේ ක්‍රියාකාරකම් එය මූල්‍ය අවදානම් මිශ්‍රනයකට නිරාවරණය කරයි. වෙළෙඳපොල අවදානම, (ව්‍යවහාර මුදල්, සාධාරණ වටිනාකම පොළී අනුපාත

අවදානම, මුදල් ප්‍රවාහ පොළී අනුපාත අවදානම සහ මිල අවදානම ඇතුළුව) ණය අවදානම සහ ද්‍රවශීලතා අවදානම ඒ අතර වේ. සංස්ථාවේ සමස්ත ණය කලමනාකරණ වැඩසටහන් සංස්ථාවේ මූල්‍ය කාර්යසාධනය මත අහිතකර බලපෑම් ඇතිකළ හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීමට ඉලක්කගත වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ප්‍රතිපත්ති යටතේ මූල්‍ය අංශය විසින් අවදානම් කලමනාකරණය සිදුකරනු ලැබේ.

a) වෙලෙඳපොල අවදානම්

(i) විදේශ විනිමය අවදානම

සංස්ථාව විසින් තමන්ට අවශ්‍ය උපකරණ ජාත්‍යන්තරව ආනයනය කරන අතර මූලිකවම ඇමරිකානු ඩොලරයේ වටිනාකමට අදාලව ව්‍යවහාර මුදල් නිරාවරණය මගින් මතුවන විදේශ විනිමය අවදානම් වලට නිරාවරණය වේ. අනාගත වාණිජ ගණුදෙනුවලින් සහ පිළිගත් වත්කම් සහ බැරකම් වලින් මතුවන සිය විදේශ විනිමය අවදානම් කලමනාකරණය කිරීම පිණිස සමාගම දේශීය නියෝජිතයන් සමග ගිවිසුම්වලට එළැඹේ.

(ii) මිල අවදානම

වෙළෙඳ භාණ්ඩ මිල අවදානමට සංස්ථාව නිරාවරණය වේ. ප්‍රධාන සැපයුම්කරුවන් සමග ගිවිසුම්වලට එළැඹීම මගින් සංස්ථාව අවදානම් අවම කරයි.

(iii) ණය අවදානම්

ණය අවදානමට නිරාවරණය වනුයේ මූලිකවම වෙළෙඳ ලැබිය යුතු දෑ වලින් වන අතර සේවා සැපයීමට පෙර සිය නව ගණුදෙනුකරුවන් සෑම කෙනෙකු සඳහා ම ණය අවදානම කලමනාකරණය කිරීමේ සහ විශ්ලේශනය කිරීමේ වගකීම සංස්ථාව සතුය.

ණය අවදානම මතු වනුයේ මුදල් හා මුදලට සමාන දෑ, බැංකු සහ මූල්‍ය ආයතන වල ඇති තැන්පතු මෙන්ම ගණුදෙනුකරුවන්ගේ ලැබිය යුතු දෑ සහ වාණිජ ගණුදෙනු වෙත ණය නිරාවරණය වීම් මගිනි. බැංකු සහ මූල්‍ය ආයතන සඳහා, ස්වාධීනව ශ්‍රේණිගත කරනු ලැබූ අවම වශයෙන් 'ඒ' ශ්‍රේණිගත කිරීම සහිත පාර්ශව පමණක් පිළිගනු ලැබේ. අවදානම් පාලනය ගණුදෙනුකරුගේ මූල්‍ය තත්ත්වය, අතීත අත්දැකීම් සහ අනෙකුත් සාධක සැලකිල්ලට ගනිමින් ණය ගුණත්වය තක්සේරු කරනු ලැබේ. අභ්‍යන්තර හෝ බාහිර ශ්‍රේණිගත කිරීම් මත පාදකව කේවල ණය සීමා පනවනු ලැබේ. ණය සීමා උපයෝජනය නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ.

(iv) ද්‍රවශීලතා අවදානම්

සංස්ථාව විසින් මූල්‍ය ප්‍රෝකථනය සිදු කරනු ලබන අතර සංස්ථාවේ ද්‍රවශීලතා අවශ්‍යතා සහතික කිරීම පිණිස නිරතුරුව සමාලෝචනය කරනු ලැබේ. එබඳු ප්‍රෝකථනයන්හි දී සංස්ථාවේ ණය මූල්‍යකරණ සැලසුම්, ප්‍රඥප්ති අනුකූලතාව සැලකිල්ලට ගනු ලැබේ. කාරක ප්‍රාග්ධන කලමනාකරණය සඳහා අවශ්‍ය කරනු

ලබන ශේෂයට වඩා සහ ඉහලින් සංස්ථාව විසින් රදවාගෙන ඇති අතිරික්ත මුදල්, බැදීම්, සපුරාලීම සඳහා යෝග්‍ය කල් පිරීම සහිත පොළී ආදායම් උපයනු පිණිස කාල තැන්පතුවලට මාරු කරනු ලැබේ.

6. ආශ්‍රිත පාර්ශව ගණුදෙනු

කාල පරිච්ඡේදය – 2019.01.01 සිට 03.10.2019

සබඳතාවයේ නම	තනතුර	ගණුදෙනුවේ ස්වභාවය
සිද්දික් එම්. ෆාරුක් මහතා	සභාපති	නැත
සුදර්ශන ගුණවර්ධන මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
එම්. කොළොන්න මිය	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
එම්. ජේ. ආර්. ඩේවිඩ් මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
එස්. මුතුකුමාරණ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	කලාකරු
බී. කේ. ආර්. බාලසූරිය මහතා	භාණ්ඩාගාර සාමාජික	නැත
නවීන් ශානක මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත

කාල පරිච්ඡේදය – 2019.03.10 සිට 2019.12.31

සබඳතාවයේ නම	තනතුර	ගණුදෙනුවේ ස්වභාවය
එම්. තලවත්ත මහතා	සභාපති	නැත
සේනාධීර මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
ඒ. ගුණවංශ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
ඒ. විමලසිරි මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත
බී. කේ. ආර්. බාලසූරිය මහතා	භාණ්ඩාගාර සාමාජික	නැත
පී. අබේසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික	නැත

සටහන 1

ආදායම්

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
ආසියානු සේවයේ ගුවන් කාල විකිණීම	11,624,771	11,047,173		11,047,173
T.W.R. ගුවන් කාල විකිණීම	100,269,279	90,535,276		90,535,276
ප්‍රාදේශීය සේවයෙහි ගුවන් කාල විකිණීම	410,261,182	451,613,159	(225,158)	451,838,317
නිශ්පාදන ගාස්තු - ස්වදේශීය සේවය	7,206,618	6,505,864		6,505,864
ත්‍රිකුණාමල ව්‍යාපෘති ආදායම	124,223,056	92,656,288		92,656,288
මරණ දැන්වීම්	2,528,651	2,848,196		2,848,196
FEBA ගුවන් කාල විකිණීම	3,743,512	3,350,259		3,350,259
	659,857,071	**658,556,215**	**(225,158)**	**658,781,373**

සටහන 2

විකුණුම් පිරිවැය

විස්තරය	2019	2018
වැටුප්, වේතන සහ දීමනා	317,246,928	312,268,053
සේවක අර්ථසාධක අරමුදල	41,772,811	38,641,756
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල	8,140,260	7,155,834
ප්‍රවාහන සහ යැපුම් දීමනා	3,353,708	2,361,144
වැඩසටහන් දීමනා	3,066,756	6,364,990
සහන පදනම් මත සේවය කළ කාර්ය මණ්ඩලය	7,234,534	6,381,641
වාහන කුලී ගාස්තු	10,188,903	7,273,519
නඩත්තු පිරිවැය	13,446,919	13,723,584
සම්බන්ධ කිරීමේ ගාස්තු	4,741,698	5,409,712
බාහිර කුළුණු කුලී කිරීම	5,305,843	
විදුලිය	170,572,953	164,105,794
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම	2,570,187	3,074,515
ගුවන් කාල විකිණීමේ කොමිස් මුදල (දේශීය)	56,240,697	62,366,843
ගුවන් කාල විකිණීමේ කොමිස් මුදල (විදේශීය)	750,658	886,289
	644,632,855	**630,013,674**

සටහන 3

වෙනත් මෙහෙයුම් ආදායම්

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
ණය මත පොලිය	11,453,664	8,723,208		8,723,208
විවිධ ආදායම් (වෙනත්)	63,551,858	63,318,379	(2,508,966)	65,827,345
ආපසු හරවා එවූ චෙක්පත් සඳහා ප්‍රාරණ නියෝජිතයන්ගෙන් දඩ	17,429	84,612		84,612
නිවාස කුලී	198,892	181,363		181,363
සංචාරක බංගලා වලින් ලද ආදායම	749,569	768,329		768,329
විශේෂ පටිගත කිරීම්	981,923	1,410,470		1,410,470
ආනයනකරුවන්, ගණුදෙනුකරුවන් හට බලපත්‍ර ලබා දීම	7,240,708	7,684,706		7,684,706
කැසට්පට අළෙවිය	2,406,604	3,902,418		3,902,418
දඩ ගිණුම්	12,470	17,795	(455,000)	472,795
සංචාරක බංගලා වලින් ලද ආදායම - අඹේවෙල	363,813	369,405		369,405
ප්‍රකාශන විකුණුම්	35,911	3,054		3,054
උප එකතුව	**87,012,842**	**86,463,739**	**(2,963,966)**	**89,427,705**
රජයේ ප්‍රදාන ක්‍රමක්ෂය	107,878,577	86,531,268	830,250	85,701,018
ත්‍රිකුණාමලය ප්‍රදාන ක්‍රමක්ෂය	155,406,674	155,406,674		155,406,674
උප එකතුව	**263,285,251**	**241,937,942**	**830,250**	**241,107,692**
මුළු එකතුව	**350,298,093**	**328,401,681**	**(2,133,716)**	**330,535,398**

සටහන **- 3.1**

රජයේ ප්‍රදාන

විස්තරය		2019	2018
ලියාපදිංචි ගාස්තු සඳහා රජයේ ප්‍රදාන		**365,000,000**	**360,000,000**
		365,000,000	**360,000,000**

3.1) ගුවන් විදුලි බලපත්‍රවෙනුවෙන් දෙන රජයේ ප්‍රදානය ලෙස රු මිලියන 365 ක් ලැබිණ.

සටහන 4

බෙදාහැරීමේ පිරිවැය

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
බොල් ණය හා අඩමාන ණය සඳහා විධිවිධාන	-	2,231,926		2,231,926
	-	**2,231,926**	**-**	**2,231,926**

සටහන 5.

වෙනත් මෙහෙයුම් වියදම්

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
බාහිර විකාශන ආයතන වෙත දායකත්වය	961,662	1,513,447		1,513,447
ප්‍රවෘත්ති සේවා හා ප්‍රවෘත්ති සාරාංශය	687,580	764,025		764,025
වෙළෙඳ දැන්වීම් සහ ප්‍රචාරණය	1,100,095	729,011		729,011
විදුලිය හා බලශක්තිය	9,780,037	3,782,571		3,782,571
තැපැල් ගාස්තු හා දුරකතන ගාස්තු	12,527,041	15,984,362		15,984,362
මුද්‍රණ කටයුතු සහ ලිපි ද්‍රව්‍ය	5,032,219	4,187,488		4,187,488
මෝටර් රථ වාහන ධාවන වියදම්	14,116,817	14,372,902		14,372,902
විකාශන උපකරණ අළුත්වැඩියා කිරීම සහ නඩත්තු	22,807,521	19,780,289		19,780,289
සංගීත උපකරණ අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු	153,200	38,200		38,200
දැව භාණ්ඩ සහ මෙවලම් අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු	3,141,044	3,435,937		3,435,937
ගොඩනැගිල්ල සහ ගෙවත්ත අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු	10,029,460	16,656,667		16,656,667
ක්ෂය වීම්	97,492,400	78,902,281	1,393	78,900,888
ක්ෂය වීම් - ත්‍රිකුණාමලය	161,224,994	159,846,172		159,846,172
මෘදුකාංග ක්‍රම ක්ෂය	2,913,028	830,250	830,250	
උත්පාදක යන්ත්‍ර කුලී ගාස්තු	-	1,705,290		1,705,290
කැසට්පට වියදම්	384,606	1,066,707		1,066,707
බදු අය කිරීම් (ESC)	3,669,880	3,769,850		3,769,850
NBT වියදම්	8,485,739	10,818,830		10,818,830
මෝටර් රථ වාහන කුලී ගාස්තු	929,807	654,763		654,763
මුද්දර ගාස්තු	112,700	47,990		47,990
ගුවන්විදුලි සංඛ්‍යාත ගාස්තු	3,881,020	9,443,807	-	9,443,807
	359,430,850	**348,330,839**	**831,643**	**347,499,196**

සටහන 06
පරිපාලන වියදම්

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
දීමනා - සංස්ථාවේ සභාපති සහ සාමාජිකයන්	1,921,878	1,462,286		1,462,286
වැටුප් චේතන හා දීමනා	145,783,069	168,504,289		168,504,289
විශේෂ දිරි දීමනා	15,952,650	15,827,700		15,827,700
සේවක අර්ථසාධක අරමුදල	34,704,645	28,789,245		28,789,245
සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල	6,457,763	6,009,685		6,009,685
කාර්ය මණ්ඩලය සඳහා අතිකාල දීමනා	37,682,813	35,818,221		35,818,221
සහන පදනම් මත සේවයෙහි නියුතු කාර්ය මණ්ඩලය	17,738,776	12,068,014		12,068,014
කොන්ත්‍රාත් කාර්ය මණ්ඩලය සඳහා චේතන	56,134,503	42,969,690		42,969,690
කාර්ය මණ්ඩල පුහුණු ගාස්තු (දේශීය)	95,000	0		
ප්‍රවාහන සහ යැපුම් දීමනා (දේශීය හා විදේශීය)	989,351	2,616,173		2,616,173
නිවාඩු දින වැටුප්	4,068,769	3,590,487		3,590,487
පාරිතෝෂිකය	30,471,666	31,435,470		31,435,470
සභාපතිවරයා විසින් කරන ලද සත්කාරක සේවා සැපයීම	237,294	342,579		342,579
අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද සත්කාරක සේවා සැපයීම	102,327	125,580		125,580
සුභසාධන	2,684,990	2,901,512		2,901,512
සෞඛ්‍ය සේවා	108,893	147,484		147,484
සාමාන්‍ය ගාස්තු	1,919,044	2,219,456		2,219,456
පුද්ගලික ආරක්ෂක සේවය	10,050,700	7,989,350		7,989,350
කුලී අනුපාතය සහ බදු	16,278,460	16,874,317		16,874,317
රක්ෂණය	4,955,384	5,170,852		5,170,852
විගණන ගාස්තු	5,040,000	435,460		435,460
නෛතික ගාස්තු	1,473,920	509,795		509,795
ප්‍රකාශන හා චාර සහරා	846,603	397,945		397,945
පාරිතෝෂිකය, නඩු සහා වෙනත් කටයුතු සඳහා දඩුවම්	690,006	521,279	**455,000.00**	521,279
	396,388,501	**387,181,869**	**455,000**	**386,726,869**

6.1) සංස්ථාව විසින් 2019 වර්ෂය සඳහා රු.156,828.961 ක් වන පරිදි කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ මරණ දැන්වීම් විකාශනය කිරීම සම්බන්ධයෙන් වියදමක් දරා ඇත. මෙය සෑම වසරකම සංස්ථාව විසින් අනුගමනය කරන පිළිවෙතකි.
මෙම දැන්වීම් විකාශය කර ඇත්තේ අනුමත පවත්නා ක්‍රමවේදයට අනුකූලවයි.
මෙය සෑම වර්ෂයකම සංස්ථාව විසින් සිදු කරනු ලබන කටයුත්තකි.

6.2) 2017 දෙසැම්බර් 31 වන දින වන විට රු. 122,356,000ක මුදලක් ගෙවන ලෙස සංස්ථාවට දන්වා ඇත.
රජයේ ආයතන වලට අයත් ඉඩම්. 2018 සහ 2019 වර්ෂයන් සඳහා මෙම ප්‍රතිපාදන ලබා දී ඇත.

තීන්දු ලබා දීමට නියමිතව පවත්නා නඩු හඹ - 2019

ශ්‍රේෂ්ඨාධිකරණයෙහි නඩු දෙකක් විභාග වෙමින් පවතී. එක් නඩුවක තත්ත්වය මෙසේය - එය දිස්ත්‍රික් අධිකරණ නඩු අංක 23089/MR දරණ නඩුවෙන් දී ඇති විනිශ්චය ඉවතලීම සඳහා සංස්ථාව විසින් ගොනු කරන ලද අභියාචනයකි - එය දිසා අධිකරණයෙහි දී පැමිණිලි පාර්ශවය වෙත රු. 10,000,000/-ක නෛතික වන්දියක් ගෙවීම සම්බන්ධයෙන් අදාල වූවකි. එක් නඩුවක් අභියාචනාධිකරණයෙහි විභාග වෙමින් පවතී. මෙයද සංස්ථාව විසින් ගොනු කරන ලද නාවලපිටිය මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු අංක: 64296 යටතේ ඇති මහේස්ත්‍රාත් අධිකරණය විසින් නිකුත් කරන ලද තීන්දුව ඉවත ලිම සඳහා කරන ලද අභියාචනයකි.

අභියාචනාධිකරණයෙහි විභාග වන නඩු තුනක් පවතී. එකී නඩු වල තත්ත්වය පහත පරිදි වේ:

එක් නඩුවක් සංස්ථාව විසින් ගොනු කරන ලද අභියාචනයක් වන අතර එය නාරාහේන්පිට මහේස්ත්‍රාත් අධිකරණ අංක 64,296 සම්බන්ධයෙන් වන සේවකයකු වෙත බේරුම්කරු විසින් බේරුම්කරණ නඩු අංක A/23/2017 යටතේ ලබා දී ඇති තීන්දුවකට එදිරිව සංස්ථාව විසින් ගොනු කළ නඩුවකට ලබා දුන් විනිශ්චයක් ඉවත ලෑම පිණිස ගොනු කරන ලද්දකි.

අනෙක් පොරොත්තුව ඇති නඩුව, අදාල වනුයේ සංස්ථාවේ එක් සේවකයකු විසින් තවත් සේවකයකු වෙත ලබා දුන් පත්වීමකට එදිරිව ගොනු කරන ලද රිට් අයදුම්පතකට අදාල වේ.

මහාධිකරණයෙහි පොරොත්තුව පවත්නා තවත් නඩු දෙකකි. එක් නඩුවක් පැමිණිලිකරු විසින් ඉල්ලා සිටින ලද රු. මිලියන 50ක් වන මුදල් ප්‍රමාණයක වන්දියක් සම්බන්ධයෙන් ගොනු කරන ලද්දකි.

අනෙක් නඩුව සංස්ථාව විසින් ගොනු කරන ලද්දකි.

දිසා අධිකරණයෙහි ගොනු කරන ලද නඩු පහකි. එක් නඩුවක, පැමිණිලිකරු විසින් රු. මිලියන 8ක් සහ පොළිය ඉල්ලා සිටී. අනෙක් නඩුවෙහි, පැමිණිලිකරු විසින් රු. 5,917,275ක් සහ පොළිය සමඟ එක්සත් ජනපද ඩොලර් 26,775ක් වන 10%ක කොමිස් මුදලක් ඉල්ලා සිටී.

අනෙක් නඩු තුන සංස්ථාව විසින් ගොනු කර ඇත.

තවද, මහේස්ත්‍රාත් අධිකරණයෙහි නඩු සතරක් පවතී. එක් නඩුවක් කම්කරු විනිශ්චය සභාවෙහි පොරොත්තුව පවතින අතර බෙරුම්කරණ නඩු තුනක් කම්කරු දෙපාර්තමේන්තුවෙහි පොරොත්තුව පවතී.

රු. 11,783,507.20 (10,000,000 + 1,783,507.20) ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල ප්‍රතිපාදන ලබා දී ඇත.

සටහන 07

මූල්‍ය පිරිවැය

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
බැංකු ගාස්තු	484,339	552,819		552,819
බැංකු අයිරා පොළිය	3,524,150	2,357,575		2,357,575
ක්‍රෙඩිට් කාඩ්පත් සඳහා කොමිස්	64,917	62,302		62,302
	4,073,406	**2,972,696**	**-**	**2,972,696**

සටහන 08

8 (i) අදායම් බදු

		2019	2018
ගිණුම් අනුව ශුද්ධ ලාභය / පාඩුව		**(394,370,449)**	**(380,127,590)**
එකතු කිරීම්			
ඉඩදිය නොහැකි වියදම්			
ක්ෂය වීම්		97,492,400	78,902,281
ක්ෂය වීම් - ත්‍රිකුණාමලය		161,224,994	159,846,172
බොල් ණය සඳහා ප්‍රතිපාදන		-	2,231,926
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		30,471,666	31,435,470
දඩ		690,006	521,279
විනෝදාස්වාදය		339,621	468,159
ආර්ථික සේවා ගාස්තු		3,669,880	3,769,850
		293,888,565	**277,175,137**
අඩු කිරීම්:			
ඉඩදිය හැකි වියදම්			
ප්‍රාග්ධන දීමනා		103,071,767	247,890,512
පාරිතෝෂික ගෙවීම්		52,934,662	49,736,515
		156,006,429	**297,627,027**
බදු අයකළ හැකි ලාභය / (පාඩුව)		(256,488,313)	(400,579,482)
ඉදිරියට ගෙන ආ බදු පාඩුවීම්		(4,076,939,762)	(3,676,360,280)
ඉදිරියට ගෙන ආ සමස්ත බදු පාඩුවීම්		(4,333,428,075)	(4,076,939,762)
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන			

ආදායම් තුලින් ලබාගනු ලබන ලාභය මත 28% ක අනුපාතයකින් ආදායම් බදු ගෙවීමට සංස්ථාව බැඳී සිටී. සංස්ථාවේ ගලපන ලද බදු පැනවිය හැකි ලාභ මත පදනම්ව ආදායම් බදු පිළිබඳ ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශ තුලින් සලසා ඇත.

ii. විලම්භිත බදු පැනවීම ගණනය කිරීම සහ LKAS 12 පරිදි විලම්භිත බදු පැනවීම හඳුනාගැනීම සලකා බැලීම

විලම්භිත බදු වත්කම් සහ වගකීම්

		2019	2018
මූල්‍ය ස්ථාවරය			
විලම්භිත බදු වගකීම්		131,349,681	109,840,670
විලම්භිත බදු වත්කම් සහ වගකීම්		(11,555,647)	(8,970,648)
ශුද්ධ විලම්භිය බදු වගකීම්		119,794,034	100,870,022
විස්තීර්ණ ආදායම් ප්‍රකාශය			
විලම්භිත බදු වගකීම්		21,509,011	30,439,150
විලම්භිත බදු වත්කම්		(2,584,999)	(2,433,880)
ශුද්ධ විලම්භිත ආදායම් බදු ආදායම (වියදම්)		18,924,012	28,005,270

සටහන 9

දේපල, යන්ත්‍රෝපකරණ සහ උපකරණ, ශී. ලං. ගු. ස.

දළ ධාරණ ගිණුම පිරිවැය මත	2019.01.01 දිනට ශේෂය රු.	අතිරේක / මාරු කිරීම් රු.	බැහැර කිරීම් / මාරු කිරීම් රු.	2019.12.31 දිනට ශේෂය රු.	ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2019.01.01 රු.	අදාල කාල සීමාව සඳහා අය කිරීම් රු.	පෙර වසරේ ගැලපුම්	ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2019.12.31 දිනට රු.	2019.12.31 දින වන විට NBW රු.
ඉඩම්	7,574,763			7,574,763					7,574,763
ගොඩනැගිලි	410,088,133	18,764,477		428,852,611	145,210,071	9,872,761	-	155,082,832	273,769,778
පිරියත සහ යන්ත්‍රෝපකරණ	649,639,799	22,715,674	(163,367,824)	508,987,649	505,974,453	8,000,824	(161,163,487)	352,811,790	156,175,858
සංගීත භාණ්ඩ	7,241,190	530,958		7,772,149	6,958,146	96,048		7,054,194	717,955
මෝටර් රථවාහන	53,863,675			53,863,675	52,230,438	552,962		52,783,400	1,080,275
දැව භාණ්ඩ, සවිකුරු	146,974,344	3,739,846	(21,168,186)	129,546,004	122,613,006	2,322,190	(21,029,490)	103,905,706	25,640,298
පටිගත කිරීමේ සහ ටේප්ඩ්	24,988,249			24,988,249	24,950,462	21,165		24,971,627	16,622
ශ්‍රවණ සංඛ්‍යාතය	1,006,263,143	30,532,357	(310,743,875)	726,051,626	768,025,858	18,063,845	(287,531,990)	498,557,713	227,493,912
සම්ප්‍රේෂක	1,629,407,044	16,457,571	(360,901,143)	1,284,963,472	1,044,575,536	33,765,195	(344,105,094)	734,235,637	550,727,836
පරිගනක උපකරන	76,530,780	43,539,823		120,070,603	52,308,262	24,795,970		77,104,232	42,966,372
පුස්තකාල පොත්	450,340			450,340		-			450,340
මෙවලම් (ආම්පන්න)	146,384	17,295		163,679	142,279	1,441		143,720	19,959
	4,013,167,844	**136,298,001**	**(856,181,028)**	**3,293,284,821**	**2,722,988,511**	**97,492,401**	**(813,830,061)**	**2,006,650,851**	**1,286,633,970**

දේපල, පිරියත සහ උපකරණ - ත්‍රිකුණාමලය

දළ ධාරණ ගිණුම පිරිවැය මත	2019.01.01 දිනට ශේෂය රු.	අතිරේක / මාරු කිරීම් රු.	බැහැර කිරීම් / මාරු කිරීම් රු.	2019.12.31 දිනට ශේෂය රු.	ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2019.01.01 රු.	අදාල කාල සීමාව සඳහා අය කිරීම් රු.	පෙර වසරේ ගැලපුම්	ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2019.12.31 දිනට රු.	2019.12.31 දින වන විට NBW රු.
පිරියත සහ යන්ත්‍රෝපකරණ	178,847,308	734,750		179,582,058	93,862,573	13,431,917		107,294,490	72,287,568
මෝටර් රථවාහන	7,544,000			7,544,000	5,544,000	1,886,000		7,430,000	114,000
දැව භාණ්ඩ, සවිකුරු	2,839,794			2,839,794	1,490,892	212,985		1,703,877	1,135,917
කාර්යාල උපකරණ	7,782,753			7,782,753	5,447,928	778,275		6,226,203	1,556,550
උත්පාදක යන්ත්‍ර	206,429,150			206,429,150	108,374,240	15,482,186		123,856,426	82,572,724
ශ්‍රවණ සංඛ්‍යාතය	53,354,383			53,354,383	27,249,505	4,001,578		31,251,083	22,103,299
සම්ප්‍රේෂක	1,506,345,613	15,563,259		1,521,908,873	778,251,495	113,144,126		891,395,621	630,513,252
පරිගනක උපකරන	52,624,075			52,624,075	52,624,075	-		52,624,075	-
ලුහු මෙවලම්	4,632,471			4,632,471	2,432,046	347,435		2,779,481	1,852,990
උපකරණ	159,206,556			159,206,556	83,300,124	11,940,491		95,240,615	63,965,941
	2,179,606,103	**16,298,009**	**-**	**2,195,904,112**	1,158,576,878	161,224,994	**-**	**1,319,801,872**	**876,102,241**

අස්පෘෂ්‍ය වත්කම්

විස්තරය	2019.01.01 දිනට ශේෂය රු.	අතිරේක / මාරු කිරීම් රු.	බැහැර කිරීම් / මාරු කිරීම් රු.	2019.12.31 දිනට ශේෂය රු.	ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2019.01.01 රු.	අදාල කාල සීමාව සඳහා අය කිරීම් රු.	පෙර වසරේ ගැලපුම්	ක්ෂය වීම් සඳහා ප්‍රතිපාදන 2019.12.31 දිනට රු.	2019.12.31 දින වන විට NBW රු.
පරිගනක මෘදුකාංග ත්‍රිකුණාමලය ව්‍යාපෘතිය	12,124,157			12,124,157	12,124,157			12,124,157	-
මෘදුකාංග	3,807,513	9,850,685		13,658,198		2,913,028		2,913,028	10,745,170

සටහන 10

ප්‍රාග්ධන නොනිමි වැඩ

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018
ප්‍රාග්ධන නොනිමි වැඩ	17,032,793	21,389,180		21,389,180
	17,032,793	**21,389,180**	**-**	**21,389,180**

සටහන 11

සංස්ථාව විසින් ලංකා පුවත් හි රුපියල් මිලියනයක ආයෝජනයක් කරන ලදී.

ආයෝජනය

විස්තරය	2019	2018
සී / ස ලංකා පුවත් සමාගමෙහි ආයෝජනය	**1,000,000**	**1,000,000**

සටහන 12,

ඉන්වෙන්ට්‍රිය

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018
පාරිභෝජ්‍ය අයිතම	20,025,662	**29,936,852**		29,936,852
හුවමාරු භාණ්ඩ	-	**17,181,235**		17,181,235
	20,025,662	**47,118,087**	**0**	**47,118,087**

සටහන 13

වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
ණය ගැතියන්ගේ ගුවන් කාලය	231,611,659	238,598,815	(225,158)	238,823,973
අඩු කළා: මූල්‍ය වත්කම් පිළිබඳ දෝෂ	(112,364,632)	(114,323,167)		(114,323,167)
කාර්ය මණ්ඩලය සඳහා ණය	4,171,986	3,914,625		3,914,625
කාර්ය මණ්ඩලය සඳහා වෙනත් අත්තිකාරම්	1,835,638	1,105,813		1,105,813
කාර්ය මණ්ඩල ණයගැතියෝ EPF	238,952	267,459		267,459
මුලින් ගෙවන ලද ගෙවීම්	-	4,447,986		4,447,986
සැපයුම්කරුවන් වෙත අත්තනිකාරම් ගෙවීම	1,114,536	1,022,692		1,022,692
සුළු ණය ගැතියෝ	20,617,238	23,421,302		23,421,302
ලක්හඬ සමඟ ගාබා ගිණුම	12,807,862	12,807,862		12,807,862
G.S.T. පාලන ගිණුම	237,267	237,267		237,267
ලැබිය යුතු ආදායම (වෙනත්)	25,484,283	30,267,805	(2,731,860)	32,999,665
රැඳවුම් බදු (ආදායම)	39,875,920	36,704,025		36,704,025
වෙනත් තැන්පතු	9,762,842	9,452,462		9,452,462
	235,393,552	**247,924,946**	**(2,957,018)**	**250,881,964**

සටහන 14,

මුදල් සහ මුදල් සමාන දෑ

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018
ලංකා බැංකුව - මාතර	138,015	12,000		12,000
මහජන බැංකුව - ජාත්‍යන්තර අංශය	184,797	134,936		134,936
ලංකා බැංකුව - ටොරින්ටන් ප්‍රධාන ගිණුම	-	24,002,549		24,002,549
ඉන්දියානු රාජ්‍ය බැංකුව	451,172	465,140		465,140
ලංකා බැංකුව - අනුරාධපුර	15,000	0		
ලංකා බැංකුව - මහනුවර	982,672	261,637		261,637
නේෂන්ස් ට්‍රස්ට් බැංකුව	3,244,526	3,570,403		3,570,403
ලංකා බැංකුව - ටොරින්ටන් ගුවන්විදුලි බලපත්‍ර	1,612,591	1,421,286		1,421,286
ලංකා බැංකුව - ටොරින්ටන් - F M ව්‍යාපෘතිය	-	0		
මුදල් අග්‍රිමය	189,920	60,395		60,395
ලංකා බැංකුව - ටොරින්ටන් - කැසට්පත විකුණුම්	-	1,313,320		1,313,320
ලංකා බැංකුව - මදුරාසිය	1,768,243	1,768,243		1,768,243
ලංකා බැංකුව - ත්‍රිකුණාමල ව්‍යාපෘතිය	31,203,239	23,408,205		23,408,205
ලංකා බැංකුව - යාපනය ශාඛාව	291,400	0		
ලංකා බැංකුව - ඉතුරුම්	104,044	100,171		100,171
ආන්තික ගිණුම (මහජන බැංකුව)		105,302,563		105,302,563
ඉතිරි කිරීමේ ගිණුම (මහජන බැංකුව)	75,989,614			
එකතුව	**116,175,232**	**161,820,848**	**-**	**161,820,848**
බැංකු අයිරා ශේෂය (ගිණුම් අංක : 265 සහ 339)	**(36,925,978)**			
මුදල් ප්‍රවාහ ප්‍රකාශය සඳහා ශේෂය	**79,249,255**			

සටහන 15

රඳවාගත් ඉපැයුම්

විස්තරය	2019	2018
ආරම්භක ශේෂය	**(98,140,157)**	**(55,337,285)**
+ ගැලපුම්	3,558,293	**44,797,895**
(-) ගැලපුම්	(367,774)	**(25,521,014)**
විස්තීර්ණ ආදායම	**(104,863,956)**	**(42,670,112)**
	(3,190,519)	**(19,409,641)**
එකතුව	**(203,004,112)**	**(98,140,157)**

සටහන 16,

විකුණුම් හා අනෙකුත් ගෙවිය යුතු

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
ණය කරුවන් ගුවන් කාලය විකිණීම	14,601,069	12,419,431		12,419,431
ආපසු ලබා දෙන විවිධ තැන්පතු	6,303,983	5,461,355		5,461,355
උපචිත වියදම්	282,771,870	279,206,565	455,000	278,751,565
E.P.F.	4,232,117	4,367,398		4,367,398
සුළු ණය හිමියෝ	12,215,702	13,967,873		13,967,873
ප්‍රාදේශීය ජංගම ගිණුම	346,800	0		
MEහි ආරක්ෂක තැන්පතුව	205,621	377,886		377,886
සැනසුම - සුනාමි	15,053	15,053		15,053
ලංකා බැංකුව - ටොරින්ග්ටන් - ප්‍රධාන ගිණුම	36,746,227	0		
ලංකා බැංකුව - ටොරින්ග්ටන් - කැසට් පට අලෙවිය	179,751	0		
ණය හිමි පාලන ගිණුම	-	6,942,341		6,942,341
රජරට සංචාරක බංගලාව	384,454	614,671		614,671
	358,002,646	**323,372,573**	**455,000**	**322,917,573**

සටහන 17,

මුදල් නොවන වගකීම්

විස්තරය	2019	2018 ගලපන ලද	ගැලපුම්	2018 අනුමත
N S L	15,007,806	15,007,806		15,007,806
Save the nation අරමුදල	(12,418)	(12,418)		(12,418)
උපයන විට ගෙවීම් බදු	100,466	76,852		76,852
රඳවාගත් බදු	887,295	235,206		235,206
VAT පාලන ගිණුම	29,407,981	35,963,066		35,963,066
ESC	53,569,469	52,628,995		52,628,995
NBT	8,112,546	17,889,571		17,889,571
ජාතික ආරක්ෂක අරමුදල	2,835	2,835		2,835
ආදායම් බදු සඳහා ප්‍රතිපාදන	692,759	692,759		692,759
දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු මුද්දර ගාස්තු	60,925	100		100
	107,829,664	**122,484,772**	**0**	**122,484,772**

සටහන 18,

වෙනත් ගෙවිය යුතු දෑ

විස්තරය		2019	2018
E.P.F. අතිරික්තය		8,551,384	11,551,385
විදුලි උත්පාදක කුලී ගාස්තු			1,851,999
		8,551,384	**13,403,384**

සටහන 19

විදේශ දීමනා

විස්තරය		2019	2018
විදේශ දීමනා - ජපාන හා කොරියානු		31,456,441	83,175,581
ත්‍රිකුණාමලය - ඩව්වෙල් දීමනාව		826,241,343	981,648,017
		857,697,784	**1,064,823,598**

සටහන 20

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්

2019 දෙසැම්බර් 31 වන දිනට

විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම් වල වර්තමාන අගයෙහි හැසිරීම

		2019	2018
වර්ෂය ආරම්භයේ විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්		**200,322,804**	**227,277,117**
ආරම්භක ශේෂ ගැලපුම්		(2,517,832)	
		197,804,972	**227,277,117**
ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගත් වියදම			
වර්තමාන සේවා පිරිවැය		9,375,532	8,140,535
ගැලපුම්			945,244
පොළී පිරිවැය		19,095,278	22,349,691
		28,470,811	**31,435,470**
අනෙකුත් විස්තරාත්මක ආදායම් වල හඳුනාගත් ආදායම			
නත්‍ය (සාක්ෂාත් කරගත්) / අලාභය		56,569,495	(11,171,098)
ගැලපුම් (සාක්ෂාත් කරගත්) අලාභය			2,517,832
			(8,653,266)
මුළු ගෙවීම්			
ගෙවූ ප්‍රතිලාභ			(2,366,132)
සැලසුම මගින් ගෙවන ලද ප්‍රතිලාභ		(50,416,830)	(46,425,141)
ගැලපුම්			(945,244)
		(50,416,830)	**(49,736,517)**
ප්‍රතිලාභයන් හි වර්තමාන අගය		**232,428,448**	**200,322,804**

ලබා ගැනීම් පිළිබඳ මූලධර්ම

වට්ටම් අනුපාතිකය		11.88%	11.88%
අනාගත වැටුප් වැඩිවීම්		3%	5%
විශ්‍රාම වයස් සීමාව		අවු 60	අවු 60
කාර්ය මණ්ඩල පිරිවැටුම් සාධකය		2%	2%

2019 දෙසැම්බර් 31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා වූ
මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. එම්ඊඩි/ඒ/එස්එල්බීසි/1/19/550

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2020 නොවැම්බර් 27 දින

සභාපති,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති වලට අනුකූල නොවීම.**

(අ) සංස්ථාව විසින් දැනට පවතින කල්බදු වත්කම් වෙනුවෙන් ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 16 යොදා ගැනීම තුළින් ඇතිවන බලපෑම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 12 හි 26 (a) ඡේදයේ අනුව විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම් සඳහා වන විලම්භිත බදු ගණනයේදී ගිණුම්කරණ පදනම් තීරණය කිරීමෙදී මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දැක්වෙන විශ්‍රාමික ප්‍රතිලාභ වගකීමෙහි ධාරණ ඵගය රු.232,428,448 ක් වුවද, විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට ගැලපූ වසරේ පාරිතෝෂික ප්‍රතිපාදනය රු.85,040,305 ක් ලෙස දක්වා තිබුණි. ඊට අමතරව බදු පදනම ශූන්‍ය විය යුතු වුවද, විශ්‍රාමික ප්‍රතිලාභ වගකීමෙහි බදු පදනම ලෙස රු.50,416,830 ක් ලෙස

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

යොදාගෙන තිබුණි. තවද වසරේ ආයුගණක අලාභය වූ රු.56,569,495 කට අදාළ විලම්භිත බදු වටිනාකම රු.15,839,459 ක් වෙනත් විස්තිර්ණ ආදායම් යටතේ දක්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 අනුව 2018 වර්ෂයේ වට්ටම් අනුපාතය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන සතියේ ආර්ථික දර්ශක පදනම් කර ගනිමින් සියයට 11.88 ක් ලෙස තීරණය කර තිබූ අතර, එම අනුපාතය 2019 වර්ෂය සඳහාද යොදාගෙන තිබුණද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ 2019 දෙසැම්බර් 27 දිනෙන් අවසන් සතියේ ආර්ථික දර්ශක අනුව භාණ්ඩාගාර බැඳුම්කර සඳහා වන වෙළඳපොල ඵලදා අනුපාත සියයට 8.64 සිට සියයට 10.54 දක්වා අගයක පැවතුණි. ප්‍රමිතියේ ඡේද අංක 84ට අනුව වට්ටම් අනුපාතය විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් සිදුකරන අතර, වර්තමාන වෙළඳපොල අනුපාත පිළිබඳව නිසි ඇගයීමක් සිදු නොකර පසුගිය වර්ෂයේ වට්ටම් අනුපාතයම සමාලෝචිත වර්ෂය සඳහාද යොදාගෙන තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 37 හි 30 ඡේදය ප්‍රකාරව තවදුරටත් අසම්භාව්‍ය වගකීම් නොවන වන්දි නඩු සඳහා ගෙවීම් රු.11,783,507 ක් නැවත වර්ගීකරණය කර වෙනත් වගකීම් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ අඩුපාඩු

(අ) විලම්භිත බදු ගණනයේදී 2018,2019 වර්ෂවල විගණනයට ඉදිරිපත් කළ උපලේඛන හා එම වර්ෂවල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දත්ත මත පදනම්ව 2019 වර්ෂය සඳහා වන විලම්භිත බදු වගකීම ස්වාධීනව ගණනය කිරීමේදී වර්ෂය අවසානයේ ශුද්ධ විලම්භිත බදු වගකීමෙහි රු. 318,240,140 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව විසින් පවත්වාගෙන යන බැංකු ගිණුම් දෙකකට අදාළව බැංකු අයිරා ශේෂය පිළිවෙලින් රු.36,746,228 ක් හා රු. 179,751 ක්, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි ජංගම වගකීම් ලෙස වෙනම දක්වනු වෙනුවට වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ තුළ ඇතුළත් කර තිබුණි.

(ඇ) ඉන්දියානු රු. 676,658 ක් වූ චෙන්නායි බැංකු ගිණුම් ශේෂය මත රු. 44,998 ක් වූ විදේශ විනිමය අලාභය හඳුනා ගෙන නොතිබීම නිසා එම වටිනාකමෙන් බැංකු ශේෂය වැඩියෙන් දක්වා තිබුණි.

(ඈ) පරිගණක මෘදුකාංග හා ගොඩනැගිලි වෙනුවෙන් පිළිවෙලින් රු. 886,166 ක් හා රු. 67,864 ක් අඩුවෙන් ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අලාභය රු.954,030 කින් අඩුවෙන් දැක්වුණි.

(ඉ) විශ්‍රාමික ප්‍රතිලාභ වගකීම තුළ පොළී පිරිවැයවල අගය රු.23,499,231 ක්, මූල්‍ය ප්‍රකාශනවල රු.19,095,278 ක් ලෙස දැක්වීම හේතුවෙන් විශ්‍රාමික වගකීම් පොළී පිරිවැය රු.4,403,953 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඊ) 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව රඳවාගත් අලාභ අවසන් ශේෂය රු.94,949,639 ක් වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශයේ ආරම්භක ශේෂය ශූන්‍යය ලෙස දක්වා තිබුණි.

(උ) 2018 වර්ෂයේ තොග සමීක්ෂණයේදී හඳුනාගත් රු.1,430,845 ක් වටිනා ඉවත් කළ යුතු සංයුක්ත තැටි, කැසට් හා සහරා තොගය අපහරණය කරන තෙක් භාවිතයට නුසුදුසු තොග ලෙස දැක්වීම වෙනුවට තොග යටතේ දක්වා තිබුණි.

(ඌ) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව විසින් ඉදිරිපත් කර තිබුණු සනාථ කිරීම් අනුව 2018 දෙසැම්බර් 31 දිනට හුන්නස්ගිරිය විකාශනාගාර භූමිය වෙනුවෙන් ගෙවිය යුතු මුළු බදු කුලිය රු.12,305,708 ක් වුවද, ගෙවිය යුතු බදු කුලි ලෙස රු.1,215,000 ක් පමණක් ගිණුම් ගතකර තිබීම නිසා ගෙවිය යුතු බදු කුලි රු.11,090,708 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(එ) විකාශනාගාරයක් පවත්වාගෙන යාම සඳහා 2009 වර්ෂයේදී දීර්ඝකාලීන බදු පදනම මත ලබාගත් කුවිවවේලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පිහිටි හෙක්ටයාර් 119.5309 ක් පමණ වූ ඉඩම සඳහා ගෙවිය යුතු බදු කුලිය වූ රු.124,344,000 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් ගිණුම්ගත කර නොතිබුණි.

(ඒ) දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ පැහැර හරිනු ලබන බදු අයකිරීමේ ඒකකයේ වාර්තා හා සංස්ථාවේ බදු ගෙවීම් සම්බන්ධව බදු ගිණුම් අනුව 2019 දෙසැම්බර් 31 දිනට මුළු බදු වගකීම (දඩ මුදල් රහිතව) රු.199,616,562 ක් වුවත් මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මූල්‍ය නොවන වගකීම් යටතේ එය රු.106,891,027 ක් ලෙස දැක්වීමෙන් ගෙවිය යුතු හිඟ බදු වටිනාකම රු.92,725,535 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.2.3 නොසැසඳූ ශේෂ

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද ගුවන්කාල ණයගැති උපලේඛන අනුව ණයගැතියන් රු.231,733,058 ක් වූ අතර මූල්‍ය ප්‍රකාශන අනුව ගුවන්කාල ණයගැති ශේෂය රු.231,611,659 ක් වූයෙන් රු.121,399ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු තැන්පතු ශේෂය රු.9,452,462 ක් වුවද උපලේඛන අනුව එම ශේෂය රු.9,032,782 විය. රු.419,680 ක හඳුනා නොගත් ශේෂයක් මූල්‍ය ප්‍රකාශනය තුල ඇතුළත් කර තිබීම හේතුවෙන් ලැබිය යුතු තැන්පතු එම වටිනාකමෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කරන ලද උපලේඛන අනුව ගුවන් කාල ණයහිමි ශේෂය රු.13,924,704 ක් වුවද, ගුවන් කාල ණයහිමි පාලන ගිණුමට අනුව එම ශේෂය රු.14,601,069 ක් වූයෙන් රු. 676,365 ක නොසැසඳුනු ශේෂයක් නිරීක්ෂණය විය.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

ගිණුම්වල වූ පහත දැක්වෙන එක් එක් වත්කම් වගකීම් හා ගෙවීම්වලට අදාළව ඒ ඒ විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

	ගිණුම් විෂයය	වටිනාකම	ඉදිරිපත් නොවූ සාක්ෂි
		රු.	
(අ)	වියදම්	856,253	ගෙවීම් වවුචර්
(ආ)	ඉඩම්	7,761,326	ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සත්‍යාපන වාර්තා
(ඇ)	ගොඩනැගිලි	193,700,207	ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සත්‍යාපන වාර්තා
(ඈ)	ලක්හඬ ශාඛා වෙළඳ ණයගැතියෝ	12,807,802	ලිපිගොනු විස්තර හා විස්තරාත්මක උපලේඛන
(ඉ)	ලංකා බැංකු වෙන්නායි බැංකු ගිණුම් ශේෂය (ඉන්දියානු රු. 676,658)	1,768,243	ශේෂ තහවුරු කිරීම්
(ඊ)	වෙළඳ ණයගැතියෝ	69,500,324	ශේෂ සනාථ කිරීම්

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංස්ථාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සංස්ථාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංස්ථාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සංස්ථාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම් ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සංස්ථාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව නිගමනය කිරීම සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවයන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සංස්ථාව පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මෙම වාර්තාවේ 1.2.2(උ),(එ),හා 1.2.3(ආ) ඡේද වල සඳහන් නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමාකිරීම තුළ පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සංස්ථාව සම්බන්ධ වී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ නීතියකට හෝ සංස්ථාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධි විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

නීතිරීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව	විස්තරය
(අ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ 03/2015 මඟින් සංශෝධිත මුදල් රෙගුලාසි 371 (2) (ආ) සහ 371(5)	අදාළ කාර්ය අවසන් කර දින 10 ක් ඇතුළත තත්කාර්ය පතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු නමුත්, එකතුව රු.1,206,006 ක් වූ අග්‍රිම ලබා ගෙන දින 33 සිට වසර 14 ක් දක්වා ප්‍රමාදව පැවතියද 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි. තවද කිසියම් විශේෂිත කාර්යයකට මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට එක් අවස්ථාවකදී රු.100,000 ක උපරිමය දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමය ලබා දිය හැකි වුවද සංස්ථාව විසින් එම සීමාව ඉක්මවා අවස්ථා 14 කදී අත්තිකාරම් ලබා දී තිබූ අතර, එයින් එකතුව රු. 538,850 ක අත්තිකාරම් දින 27 සිට දින 567 ක් දක්වා ප්‍රමාද වී තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.
(ආ) 2015 මැයි 05 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015 (i) 3.1 ඡේදය	සංස්ථාවේ නිලධාරීන් 04 දෙනෙකු වෙනුවෙන් වෙන් කර ඇති වාහන සඳහා 2019 වර්ෂයේ හා 2020 වර්ෂයේ ජුනි දක්වා වූ කාලය සඳහා අනුමත ඉන්ධන සීමාවන් ඉක්මවා ලබාගත් අතිරේක ඉන්ධන සඳහා රු.1,323,456ක වියදමක් දරා තිබුණි. මෙයින් 2019 අප්‍රේල්, ජුනි, ජූලි හා අගෝස්තු මාස හා 2020 ජනවාරි මාසය සඳහා දරා තිබූ රු.553,574ක වියදම් සඳහා පමණක් අධ්‍යක්ෂ මණ්ඩලයේ ආවරණ අනුමැතිය ලබා ගෙන තිබුණි. තවද 2020 පෙබරවාරි සිට ජුනි දක්වා සංස්ථාවේ සභාපතිවරයා වෙනුවෙන් වෙන්කළ වාහනයට හිමි මාසික ඉන්ධන සීමාව ඉක්මවූ ඉන්ධන සඳහා රු.95,763 ක් වැයකර තිබුණි.
(ඇ) 2015 මැයි 05 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක PED 1/2015 හි 3.3 ඡේදය හා 2016 මාර්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 05/2016 හි 02 ඡේදය	නිල වාහනයක් හිමි නිලධාරියෙකුට එම නිල වාහනය පාවිච්චි කිරීම හෝ නිල වාහනය වෙනුවට රු. 50,000 ක මාසික ප්‍රවාහන දීමනාවක් හා අදාළ තනතුරට හිමි මාසික ඉන්ධන දීමනාව ලබා ගැනීම යන විකල්ප දෙකෙන් එකක් තෝරා ගත හැකි වුවත් එය නොසලකා සභාපතිවරයා වෙත 2020 පෙබරවාරි මස සිට නිල රථයක් වෙන් කර දී තිබියදී 2020 අප්‍රේල් සිට ජූලි දක්වා කාලය සඳහා ප්‍රවාහන දීමනාව ලෙස රු. 200,000 ක් හා ඉන්ධන දීමනාව ලෙස රු. 93,160 ක් ගෙවා තිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි

(i) මුදල් රෙගුලාසි 110	සංස්ථාව විසින් සමාලෝචිත වර්ෂය සඳහා හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.
(ii) මුදල් රෙගුලාසි 396 (ඇ) (ii) හා (iii)	2019 දෙසැම්බර් 31 දිනට වලංගු කාලය මාස 6 ඉක්ම වූ නමුත් ගෙවීම් සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ රු. 277,986 ක් වටිනා වෙක්පත් 60 ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.
(ඉ) ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ මාණ්ඩලික නිවේදන අංක : එස්.එල්.බී.සී/3142 හි 4 වගන්තිය	2019 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබූ අත්තිකාරම් අතරින් නිලධාරියෙකුට ලබා දුන් එක් අත්තිකාරම් මුදලක් පියවා නොතිබියදී නැවත නැවත එම නිලධාරියාටම අත්තිකාරම් ලබා දී තිබූ අවස්ථා 10 ක් නිරීක්ෂණය විය. ඒ අනුව වර්ෂය පුරා නිලධාරීන් 10 දෙනෙකු අත රැඳී තිබූ මුදල රු.1,476,171 ක් විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2019 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මේ අන්තර්ගත ව්‍යාපෘති අතරින් අත්‍යාවශ්‍යයෙන් ඉටු කළ යුතු රු. මිලියන 38.95ක ව්‍යාපෘති 05ක් 2020 සැප්තැම්බර් 25 දින වන විටත් ඉටුකර නොතිබුණි.2019 දෙසැම්බර් 31 දිනට සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව ප්‍රාග්ධන ප්‍රතිපාදන ලෙස ලැබී බැංකු ගත කර තිබූ මුදල රු. මිලියන 75ක් වූ අතර එයින් රු. මිලියන 63.5ක් 2015 වර්ෂයේ සංස්ථාවේ නවීකරණ කටයුතු සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණි.

(ආ) යාපනය යාල් (FM) එෆ්.එම් සේවය සඳහා මැදිරි සංකීර්ණයක් ඉදිකිරීම සඳහා 2018 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්මට රු.මිලියන 42.50 ක ප්‍රතිපාදන වෙන්කර තිබුණ ද, 2019 වර්ෂය වන විට එම ප්‍රතිපාදන රු.මිලියන 28 දක්වා සංශෝධනය කර තිබූ අතර ගොඩනැගිල්ල ඉදිකිරීමට අදාළ ඉඩම 2019 වර්ෂය අවසන් වනතුරු නිරවුල් කර ගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විටද මෙහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොතිබුණු අතර ගොඩනැගිලි ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාළ ප්‍රමාණ පත්‍ර සහ පිරිවැය ඇස්තමේන්තු සකස් කර 2020 සැප්තැම්බර් 15 දින වනවිට වසර 02 කට අධික කාලයක් ගත වී තිබුණි.

3. වෙනත් විගණන නිරීක්ෂණ

3.1 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

(අ) 1986 වර්ෂයේ සිට පැවත එන වර්ෂ 32 කට වඩා පැරණි කාර්ය මණ්ඩලය වෙනුවෙන් වැඩිපුර ගෙවන ලද රු. 238,952 ක සේවක අර්ථසාධක අරමුදලේ දායක මුදල් 2020 ජූලි 23 වන විටත් අයකර නොගෙන ඉදිරියට ගෙන එමින් පැවතුණි.

(ආ) 2017 හා 2018 වර්ෂයන්හිදී සැපයුම්කරුවන්ට ගෙවා තිබූ රු.449,415 ක් වූ අත්තිකාරම් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර නොගෙන වෙළෙඳ ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ඇ) වර්ෂ 02 සිට වර්ෂ 19 දක්වා පැරණි ලැබිය යුතු විවිධ ආදායම්, ලැබිය යුතු විදුලි ගාස්තු සහ විවිධ ණයගැතියන් එකතුව රු.29,753,026 ක් අයකර ගැනීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විටත් සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 10 කට වඩා පැරණි රු.61,163,788 ක් වූ විදේශ ණයගැති ශේෂය හා රු.29,965,096 ක දේශීය ණයගැති ශේෂය අයකර ගැනීම සඳහා 2019 දෙසැම්බර් 31 දින වන විටත් සංස්ථාව කටයුතු කර නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාවට ගෙවිය යුතු එකතුව රු.149,420,035 ක් වූ ශේෂය 1981 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා එනම්, වර්ෂ 38 ක කාලයක සිට නිරවුල් කිරීමකින් තොරව පවතින බව නිරීක්ෂණය විය.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

සංස්ථාවේ ශ්‍රව්‍ය සම්පත් ඩිජිටල් සංරක්ෂණය කරන ලද දත්ත ගබඩා කිරීම සඳහා 2017 වසරේ සිට කොරියානු ආධාර යටතේ ලද කොරියානු සේවාදායකය (Server) භාවිතා කරන අතර එයට ඩිජිටල් සංරක්ෂණය කරන ලද "ගීත" පමණක් ගබඩා කරන නමුත් "වැඩසටහන්" ගබඩා කර නොතිබුණි. මේ හේතුවෙන් සංස්ථාව අපේක්ෂා කළ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණ අතර අදාල කොරියානු ආයතනය සමඟ මාර්ග ගත විධාන (Online Command) මඟින් සම්බන්ධ වී වැඩසටහන් යාවත් කාලීන කර ගැනීමට 2017 ඔක්තෝබර් සිට කටයුතු කර නොතිබුණි.

3.3 නිෂ්ක්‍රීය/ඌන උපයෝජිත වත්කම්

(අ) සංස්ථාව සතු නිෂ්කාර්යව පවතින ගොඩනැගිලි වල බිම් ප්‍රමාණය වර්ග මීටර් 1126.45 ක් වූ අතර එම ගොඩනැගිලි සංවර්ධනය කර ඵලදායී කාර්යයකට යෙදවීමට හැකියාව තිබියදී සංස්ථාව විසින් නිසි නඩත්තුවකින් තොරව දිගු කාලයක් පැවතීම නිසා ගොඩනැගිලි විනාශයට පත්වෙමින් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) සංස්ථාව සතු වාහන 06ක් මාස 6 සිට වර්ෂ 3 ක කාලයක් නිශ්කාර්යව පැවති අතර මෙම වාහන අපහරණය කිරීමට කටයුතු කරමින් සිටින බව දන්වා තිබුණ ද එයින් වාහන 04 ක් අපහරණය කිරීමේ කටයුතු වර්ෂ 02 කට වැඩි කාලයක් ප්‍රමාද කර තිබුණි.

3.4 මූල්‍ය කළමනාකරණය

පෞද්ගලික බැංකුවක සංස්ථාවට අයත් ජංගම ගිණුමක රු. 3,244,526 ක් සමාලෝචිත වර්ෂය තුල ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතීම හේතුවෙන් එම මුදල් පොලී ලැබෙන ගිණුමක තැන්පත් කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම් අහිමි වී තිබුණි.

3.5 **වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම.**

2016, 2017 සහ 2018 වර්ෂයන් සඳහා වන වාර්ෂික වාර්තාවන් 2020 ඔක්තෝබර් 06 දින වනවිටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

2019 විගණකාධිපති වාර්තාව සඳහා සංස්ථාවේ පරිකථනය

ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධ සංස්ථා පරිකථනය

ඉහත සඳහන් වාර්තාව සඳහා සංස්ථාව විසින් සකස් කළ පිලිතුරු වාර්තාව පහත පරිදි ඉදිරිපත් කරමි.

1.2.1 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට හා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

අ. **ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති 16**

අදාල කල්බදු වත්කම් ඉවත් කිරීම සම්බන්ධයෙන් සංස්ථාව නිශ්චිත තීරණයක් ගෙන නොමැති හෙයින් තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් කිරීමට හැකියාවක් නොමැත.

ආ. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12**

විගණන නිරීක්ෂණ හා එකඟ වේ. ඉදිරි වර්ෂවලදී නිවැරදි කිරීමට කටයුතු කිරීම සඳහා සටහන් කර ඇත.

ඇ. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 19**

විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2019 වර්ෂයේදී වැටුප් පරිවර්තන චක්‍රලේඛවල වැටුප් වැඩිවීම්වල බලපෑම් නිවැරදි කිරීම හේතුවෙන් මෙලෙස අලාභයක් වාර්තා වී ඇත. 2020 වර්ෂයේ ආර්ථික දර්ශකය පදනම් කර ගනිමින් නිවැරදි කිරීමට නියමිතය.

ඈ. **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 37**

විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 2020 වර්ෂයේ ගිණුම් සකස් කිරීමේදී නිවැරදි වර්ගීකරණය යටතේ දක්වනු ලැබේ.

1.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

අ. විලම්භීත බදු වගකීම ගණනය කිරීමේදී නිරීක්ෂණය වන වෙනස්කම් 2020 වර්ෂයේ නිවැරදි කිරීමට පියවර ගනු ලැබේ.

ආ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට නියමිතය.

ඇ. විගණන නිරීක්ෂණ හා එකඟ වේ.

ඈ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර 2020 වර්ෂයේදී නිවැරදි කර ඇත.

ඉ. විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර, 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට නියමිතය.

ඊ.. විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර, 2020 වර්ෂයේදී නිවැරදි කර ඇත.

උ. විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර, 2020 වර්ෂයේදී නිවැරදි කර ඇත.

උ. හුන්නස්ගිරිය විකාශනාගාර භූමිය වෙනුවෙන් ගෙවිය යුතු මුළු බදු කුලිය ගිණුම්ගත කිරීමේදී දෝෂයක් සිදුවී ඇති බව පිළිගන්නා අතර මෙම ගැටලුව රාජ්‍ය වැවිලි සංස්ථාව සමග සාකච්ඡා කර බදු කුලිය සම්බන්ධ ගැටළුව විසඳා ගැනීමට කටයුතු කරමින් ඇත.

එ. මේ සම්බන්ධයෙන් අදාල ආයතන සමග සාකච්ඡා කර අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් මගින් බදු කුලිය ඉවත් කර ගැනීමට කටයුතු කරමින් ඇත.

ඒ. සංස්ථාවේ බදු වගකීම සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ලේඛන පරීක්ෂා කර සංස්ථා ගිණුම් නිවැරදිව ගැලපුම් කිරීමට නියමිතව ඇත.

1.2.3 නොසැසඳූ ශේෂ

අ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, නිරීක්ෂණය වී ඇති වෙනස 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට නියමිතය.

ආ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, පරීක්ෂා කර 2020 වර්ෂයේ නිවැරදි කිරීමට නියමිතය.

ඇ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, පරීක්ෂා කර 2020 වර්ෂයේ නිවැරදි කිරීමට නියමිතය.

1.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

අ	වියදම්	රු. 856,253 වටිනා ගෙවීම් වවුචර්පත් පසුව විගණනයට ඉදිරිපත් කර ඇත.
ආ	ඉඩම්	විගණන නිරීක්ෂණ හා එකඟ වේ. ඉඩම් සම්බන්ධ වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කර ඇති අතර, ස්ථාවර වත්කම් ලේඛනය මුදල් රෙගුලාසි අනුව පොදු 287 ආකෘතියට අනුව සකස් කරමින් ඇත.
ඇ	ගොඩනැගිලි	ඉහත පිළිතුර අදාල වේ.
ඈ	ලක්හඬ ශාඛා වෙළඳ ණයගැතියෝ	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.
ඉ	ලංකා බැංකු චෙන්නායි බැංකු ගිණුම් ශේෂය	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.
ඊ	වෙළඳ ණයගැතියෝ	විගණන නිරීක්ෂණ හා එකඟ වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් විගණනය ඉදිරිපත් කර ඇති කරුණු හා එකඟ වේ.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ඉහත කරුණ සම්බන්ධයෙන් විගණනය ඉදිරිපත් කර ඇති කරුණු හා එකඟ වේ.

2. **වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

ඉහත කරුණ සම්බන්ධයෙන් විගණනය ඉදිරිපත් කර ඇති කරුණු හා එකඟ වේ.

නීති රීති, රෙගුලාසි හෝ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද විධිවිධානවලට යොමුව

අ. විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර, නොපියවූ අත්තිකාරම් සම්බන්ධයෙන් දැඩි අවධානය යොමුකර කටයුතු කිරීමට නියමිතය

ආ. විගණන නිරීක්ෂණ හා එකඟ වේ. 1/2015 චක්‍රලේඛය අනුව 2020 වර්ෂයේදී කටයුතු කිරීමට නියමිතය.

ඇ. i. විගණන නිරීක්ෂණ හා එකඟ වේ.

ii. විගණන නිරීක්ෂණ හා එකඟ වන අතර, 2020 වර්ෂයේදී නිවැරදි කිරීමට නියමිතය.

ඉ. විගණන නිරීක්ෂණ හා එකඟ වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාව අනුව, සංස්ථාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සංස්ථාවේ සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අ. 2020 වර්ෂය අවසාන වන විට මෙම නවීකරණ කටයුතු නිම කිරීමට සැලසුම් කර ඇත.

ආ. යාල් එෆ් එම් සේවය ආරම්භ කිරීම සඳහා ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරමින් පවතී.

3. **වෙනත් විගණන නිරීක්ෂණ**

3.1 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

අ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, ශේෂ ගිණුම්වලින් ඉවත් කිරීම සඳහා අදාල කටයුතු කරමින් ඇත.

ආ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, සැපයුම් කරුවන්ගේ අත්තිකාරම් ගිණුම නිවැරදි කිරීමට නියමිතය.

ඇ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, විවිධ ණයගැතියන් අයකර ගැනීම සඳහා, අදාල කටයුතු කිරීමට නියමිතය.

ඈ. විගණන නිරීක්ෂණ සමග එකඟ වේ.

ඉ. විගණන නිරීක්ෂණ නිවැරදි වන අතර, 2016 වර්ෂයට පෙර ශේෂ නිරවුල් කර ගැනීම සඳහා අදාල කටයුතු කිරීමට නියමිතය.

3.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

විගණනය සඳහන් කර ඇති කරුණ සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස සැලකිල්ල දක්වා කටයුතු කිරීමට නියමිතය.

3.3 **නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්**

අ. විගණනය සඳහන් කර ඇති කරුණු සම්බන්ධයෙන් ඉදිරියේදී ක්‍රියාත්මක වීමට නියමිතය.

ආ විගණනය සඳහන් කර ඇති වාහන අපහරණය කිරීමේ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක වෙමින් ඇත.

3.4 **මූල්‍ය කළමනාකරණය**

හදිසි අවස්ථාවලදී ප්‍රයෝජනයට ගැනීම සඳහා රඳවා ගෙන ඇත.

3.5 **වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම**

2016 - 2021.03.01 වන දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිණිස අනුමැතිය ලබා දී ඇත.

2017 - 2020.01.22 දින අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කර ඇත.

2018 - 2021.03.25 දින රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙත මුද්‍රණයට යොමු කර ඇත.

සභාපති
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව



ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව

இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்

Sri Lanka Broadcasting Corporation

Printed at the State Printing Corporation